වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2022

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய சபை மற்றும் முதியோர்களுக்கான தேசிய செயலகம்
National Council For Elders And National Secretariat For Elders

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය.
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு
Ministry of Women, Child Affairs and Social Emplowerment

පටුන

පටුන........1

පූර්විකාව........2

විධායක වාර්තාව........3

හැඳින්වීම........4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය........5

දැක්ම........5

මෙහෙවර........5

සංවිධාන සැලැස්ම 2022........6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2022........7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වර්තාව 2022........8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව 2022........9

2022 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය........15

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබාදීම 2022........15

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරිම 2022........16

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන........17

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු 2022........19

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය........20

භාණ්ඩාගාර අරමුදල........22

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය........22

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය........24

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය........25

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය........26

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්........27

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල........38

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය........38

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය........40

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය........41

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය........42

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්........43

විගණකාධිපතිගේ වාර්තාව........49

විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධ පිළිතුරු........58

පූර්විකාව

ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා අභිමානය සහතික කරමින් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරලීම වෙනුවෙන්, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ පනත සහ 2011 අංක 5 දරණ සංශෝධිත පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත බලය පවරා ඇත.

වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය, ආත්මාභිමානය, ස්වාධීනත්වය,සහභාගීත්වය,රැකවරණය, හා ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රමුඛ කාර්යභාර්ය වේ.ඒ අනුව විශේෂයෙන්ම වත්මන් රජයේ පරමාර්ථ හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතු කාර්යභාරය මැනවින් අවබෝධ කොට ගෙන ක්‍රියාකිරීමෙන් 2022 වර්ෂයේ දී ශ්‍රී ලාංකීය වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් ඵලදියී සේවාවන් රැසක් ඉටුකරන්නට හැකිවීම සතුට දනවන කරුණකි.

2022 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය,අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්වල කාර්ය සාධනය ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ අරමුණයි.

විධායක වාර්තාව

2022 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කළ අතර, ඒ අනුව 2022 වර්ෂයේ අපේක්ෂිත භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි විය.

වත්මන් රජයේ "සෞභාග්‍ය දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක මහජන ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජයගැනීමට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත. එසේම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්තුමා හා එම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයෙන් ද, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් ලද සහය කෘතවේදීව සිහිපත් කරමි.

එමෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තූතිය හිමි විය යුතුය.

කෙසේ නමුදු 2022 වර්ෂයේ භෞතික හා මූල්‍ය ඉලක්ක වලට අදාලව අප ලබාගත් කාර්ය සාධනය පිළිබඳ අදාල තොරතුරු ඉදිරි පිටුවල විස්තරාත්මකව දැක්වේ.

හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදු වූ සමාජ,ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය,පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස මරණ හා උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම සිදුවීමත් සමඟ මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි.ඒ අනුව වර්තමානයේ 14.6% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 21% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුහසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය.ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි.2022 වර්ෂයේදි වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා වෙනුවෙන් ආධාර ලබා දීම,ග්‍රාමීය වැඩිහිටි කමිටු,ප්‍රාදේශිය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය සවිබල ගැන්වීම,අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් රු.2,000/- වැඩිහිටි දීමනාව ගෙවීමේ කටයුතු හා අවුරුදු 100 සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/- මහජන දීමනාව ගෙවීමේ කටයුතු සිදුකොට ඇත.තවද අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම,වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,වැඩිහිටියන්ගේ සනීපාරක්ෂාව වැඩිකරලීම උදෙසා අවම පහසුකම් ලබාදීම යනාදි ව්‍යාපෘති වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ සිදුකොට ඇත.එමෙන්ම වැඩිහිටිගේ මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම වැනි දෑ ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්,කායික,මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් රැකදීම අපගේ අභිප්‍රාය වේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිතම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරි, ජවසම්පන්න හා
ඵලදායි වැඩිහිටි දිවියක් උදාකිරීම.

මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගිත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

සංවිධාන සැලැස්ම - 2022



වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2022



නම	තනතුර
1. නීල් බණ්ඩාර හපුහින්න මයා	සභාපති
2. සී.ඩී.කළුආරච්චි මයා	උප සභාපති
3. කේ.ජී.ලැනරොල් මයා	ලේකම්
4. එච්.එම්.ඒ.යූ.කේ.හේරත් මිය	සාමාජික
5. ජොෂ්ඨ මහාචාර්ය එල්.දිසානායක මයා	සාමාජික
6. වෛද්‍ය ශිරෝමි මාදුවගේ මිය	සාමාජික
7. මහාචාර්ය පූජ්‍ය කෝන්ගස්තැන්න ආනන්ද හිමි	සාමාජික
8. සමන්ත ලියනවඩුගේ මයා	සාමාජික
9. ජී.වී.ඒ.ද.සිල්වා මයා	සාමාජික
10.නීතිඥ ටී.එම්.ජේ.සුමේධ මයා	සාමාජික
11. ලුතිනල් කර්නල් එස්.එම්.සී.සුනිල් සිරිවර්ධන මයා	සාමාජික
12. වෛද්‍ය පද්මා ගුණරත්න මිය	සාමාජික
13. මහින්ද මඩිහේවා මයා	සාමාජික
14. ඩී.ටී.සුතර්ශන් මිය	සාමාජික
15. එච්.වජිර ශ්‍රී ස්වර්ණ බණ්ඩාර මිය	සාමාජික
16. ඒ.ඩී.ආර්.ඒ.ඩබ්ලිව්.ඥාණසිරි මයා	සාමාජික

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වර්තාව -2022

වර්තමානය වන විට වැඩිහිටි ජනගහනය වර්ධනය වීම සමාජ ගැටලුවක් වන තරමට වර්ධනය වී ඇත.දිනෙන් දින සීග්‍රයෙන් වැඩිහිටි ජනගහනය ඉහළ යමින් පැවතීම අනාගතයේ ගැටළුවක් නොවීම පිණිස වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා සැලසුම් සම්පාදනය කිරීමේ ප්‍රධාන වගකීම අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා "2011 අංක 05 දරණ පනතින් සංශෝධිත, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් " ලැබී ඇති බලතල අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබයි.ඒ අනුව එම කාර්යයන් ඉටු කිරීමට පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් විවිධාකාර වැඩසටහන් රාශියක් සංවිධානය කරමින් ක්‍රියාත්මක කරන අතර,2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන "වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල" මඟින් ද වැඩිහිටි සුභසාධන සේවා වඩාත් පුළුල් අර්ථයකින් සාධනීය ප්‍රතිඵල අපේක්ෂාවෙන් දියත් කරන්නට යෙදුනි.

මෙම කාර්යභාරය ඉටු කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරණ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවත්,ජාතික වැඩිහිටි මහල්කම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයත් කැපවීමෙන් කරන සේවය අගය කළ යුතු අතර සෙසු පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැඩිහිටි ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් කැපකරමින් කරනා මෙහෙවර අගය කරන අතර මාගේ කෘතඥතාව මේ සියලු දෙනා වෙත පුද කර සිටිමි.

එසේ වුවද මේ වනවිට ලංකාවේ මිලියන 3 කට අධික වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාව මෙවැනි ආයතනයකට සීමා කරමින් ඉටු කිරීම මහත් අභියෝගයක් මෙන් ම අසීරු කාර්යයක් වන හෙයින්,ආර්ථික ස්ථායිතාවක් සහිත පවුල මූලික කේන්ද්‍රස්ථානය වූ සමස්ත සමාජය විසින් සීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාවට කැපවී වැඩිහිටියන් සඳහා සුරක්ෂිත හෙට දිනක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට කාලය එළඹ ඇති බව මාගේ හැඟීමයි.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව - 2022

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ අතකරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා

- **වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු2,000/- දීමනාව**

අභිමානවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ඔවුන් හට ගරුබුහුමනින් ඒ සඳහා අත්වැලක් සැපයීම හා වැඩිහිටි සුභසාධන වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 2,000/-ක දීමනාවක් ගෙවීමට කටයුතු කොට ඇත.එමෙන්ම රුපියල් 2,000/- ක නිත්‍ය දීමනාව ලබන ප්‍රතිලාභින් වෙත අමතර (TOP UP) දීමනාවක් ලෙස රුපියල් 3,000/- ක මුදලක් ලබාදීම මෙන්ම.පොරොත්තු ලේඛනගතව සිටින ප්‍රතිලාභින් වෙත රුපියල් 5,000/- ක දීමනාවක් ලබා දීමට ද කටයුතු කොට ඇත.

- **වයස අවුරුදු 100ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු 5,000/- දීමනාව**

වයස අවුරුදු 100 ඉක්ම වූ වැඩිහිටියන් රටක ඉතා වැදගත් කණ්ඩායමක් සේ සැලකිය හැකිය. අවුරුදු 100 ඉක්ම වූ වැඩිහිටියන් රටක සංවර්ධනය පිළිඹිබු කරන, විශේෂයෙන්ම සෞඛ්‍ය සම්පන්න ජාතියක් සිටින රටක් ලෙස තහවුරු කිරීම සඳහා වන මිණුම් දණ්ඩක් ලෙසට සැලකිය හැකි අතර, එක් අතකින් එය රටක ජාතික අභිමානයට ද හේතු වන කරුණක් සේ සැලකිය හැකිය. ඒ අනුව වයස අවුරුදු 100 ඉක්ම වූ සියළුම වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 5,000/-ක දීමනාව ගෙවීම මෙන්ම, රුපියල් 5,000/- ක නිත්‍ය දීමනාව ලබන ප්‍රතිලාභින් වෙත අමතර (TOP UP) දීමනාව ලෙස රුපියල් 2,500/- ක මුදලක් ලබා දීමට ද කටයුතු කොට ඇත.

<u>භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්</u>

01. පුහුණු, පර්යේෂණ හා දැනුවත් කිරීම.

"ළමා ලෝකයයි - වැඩිහිටි වියයි" වැඩිහිටියන් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන.

මේ හරහා දරුවන් හා වැඩිහිටියන් අතර අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ 2022 වර්ෂය සඳහා රු.මි. 0.70 ප්‍රතිපාදන වෙන් කළ අතර, වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක කරමින් රු.මි. 0.48 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

02. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

රජයේ විධිවිධාන වලට අනුකූලව සකස් කරන ලද ඉහළ ප්‍රමිතියකින් හා ගුණාත්මකභාවයකින් යුක්ත වූ හැඳුනුම්පතක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ලබා දීම මේ මඟින් සිදු වේ. මේ සඳහා 2022 වර්ෂය තුළ රු.මි. 2.55 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, වර්ෂය තුළ නව හැඳුනුම්පත් 50,082 ක් නිකුත් කරමින් රු.මි. 2.16 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

03. වැඩිහිටියන්ට වඩා හොඳ පහසුකම් සැපයීම සඳහා වැඩිහිටි නිවාස නඩත්තු කිරීම, ආධාර සැපයීම හා වැඩිහිටි නිවාස පරීක්ෂාව.

දිවයින පුරා පිහිටා ඇති 306 ක් පමණ වූ වැඩිහිටි නිවාසයන්හි රැකවරණය ලබන වැඩිහිටියන්ගේ තම සැඳෑ සමය ඉතා අර්ථවත්ව, සතුටින් සහ ආරක්ෂකාරීව ගතකිරීමට හැකිවෙනු වස් තම සේවාදායකයන් හට ගුණාත්මක, කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් සැපයීමට හැකිවන පරිදි දිවයිනේ සෑම වැඩිහිටි නිවාසයකම තත්වය උසස් කිරීම උදෙසා අත්‍යාවශ්‍ය ඉල්ලීම් පදනම් කරගනිමින් එහි අලුත් වැඩියාවන්, උපකරණ ලබාදීම් සහ වෙනත් අත්‍යවශ්‍යතා සඳහා ආධාර උපකාර කිරීම මෙමඟින් සිදුකෙරේ.

එමෙන්ම ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන රජයේ හා පෞද්ගලික අංශයෙහි වැඩිහිටි නිවාස වල තත්වය, පවතින අක්‍රමිකතාවයන් ,නේවාසික වැඩිහිටියන්ට සපයන සේවාවන්, පිළිබඳව නිරතුරුව අධීක්ෂණය හා පරීක්ෂා කිරීම තුලින් නේවාසික වැඩිහිටියන්ට යහපත් හා ඵලදායී සේවාවක් සැලසීම මෙහි අරමුණයි. තවද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් පාලනය වන කතරගම රජයේ වැඩිහිටි නිවාසය සහ මාලිගාතැන්න ඒව්ජින් නෝනා වැඩිහිටි නිවාසයේ පරිපාලන වියදම්, පුනරාවර්ථන වියදම් සහ අත්‍යාවශ්‍ය නඩත්තු වියදම් දැරීම මෙමඟින් සිදුකෙරේ.මේ සඳහා 2022 වර්ෂය වෙනුවෙන් රු.මි.1.56 ක ප්‍රතිපාදන වෙන් කොට රු.මි. 1.54 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

04. මාධ්‍ය හා ප්‍රකාශන.

“සාර්ථක වැඩිහිටි දිවියට මඟ” පොත මුද්‍රණය කිරීම,පුස්තකාලය පවත්වාගෙන යාම සඳහා නව පොත් මිලදී ගැනීම යනාදි මාධ්‍ය හා ප්‍රකාශන කටයුතු වෙනුවෙන් මෙම වර්ෂය තුළ රු.මි. 3.51 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2022 වර්ෂය සඳහා රු.මි. 1.37 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

05. අධීක්ෂණ හා පරිපාලන වියදම්.

වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ලබා දෙන වැඩිහිටි දීමනාවට අදාලව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු වෙනුවෙන් අවශ්‍ය ලිපි ද්‍රව්‍ය දීමනා සහ වැඩිහිටි දීමනාවට අදාල සහතිකපත්, ලෙජර් මුද්‍රණය සඳහා මුදල් ලබා දීම මේ යටතේ සිදු කරන ලදී.ඒ අනුව 2022 වර්ෂය සඳහා රු.මි.6.40 ක ප්‍රතිපාදන වෙන් කර ඉන් රු.මි. 5.15 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

06. වැඩිහිටියන් සඳහා වූ නීති පහසුකම් සැපයීම.

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවා ඇත. ඒ අනුව ජාතික සභාව පැවැත්වීම, සමාජීක දීමනා ගෙවීම හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා වියදම් දරා ඇත.එමෙන්ම 2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනතේ 24 වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය සාමාජිකයින් 5 කින් සැදුම්ලත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන අධිකරණමය බලය සහිත ආයතනයක් වේ.එහි සමාජික දීමනා ගෙවිම හා සංග්‍රහ වියදම් මෙමඟින් සිදු කර ඇත.තවද විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විම යනාදී කටයුතු සඳහා 2022 වර්ෂයේ දී රු.මි 3.78 ක මුල්‍ය ප්‍රතිපාදන වෙන් වූ අතර ඉන් රු.මි.2.98 ක මුල්‍ය ප්‍රගතියක් අත්කරගත ඇත.

07. වැඩිහිටි ස්වයං රැකියා ආධාර ලබා දීම.

ස්වයං නිර්මාණශීලි හැකියාවන් හා අත්දැකීම් පදනම් කරගනිමින් වැඩිහිටි පුරවැසියන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා රු. 30,000/ ක උපරිමයකට යටත්ව ස්වයං රැකියා ආධාර ලබා දීම සිදු කරනු ලැබීය. ඒ අනුව 2022 වර්ෂයේ රු.මි.5.22 ක වෙන් වු ප්‍රතිපාදනයන්ගෙන් වැඩිහිටි ස්වයං රැකියාලාභින් 182 දෙනෙකු වෙත මූල්‍ය අනුග්‍රහකත්වය ලබා දෙමින් රු.මි.5.22 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

08. ග්‍රාමීය වැඩිහිටි සංවිධාන සවිබල ගැන්වීම.

ග්‍රාමීය වැඩිහිටි සංවිධාන සවිබල ගැන්වීම සඳහා නව රීති මාලාවක් සකස් කර දීම මේ යටතේ සිදු වී තිබේ. 2022 වර්ෂයේදී රු.මි. 1.52 ක මුදලක් මේ සඳහා වෙන් වු අතර,රු.මි.1.33 ක මූල්‍ය වියදමක් දරා ඇත.

09. ජාත්‍යාන්තර වැඩිහිටි දිනය සැමරීම.

ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගනිමින් වැඩිහිටි උත්සව පැවැත්වීම සඳහා 2022 වර්ෂයේ දී රු.මි 0.5 ක ප්‍රතිපාදන වෙන් වු අතර, ඒ සඳහා රු.මි 0.18 ක මූල්‍ය වියදමක් දරා ඇත.

10. වෙනත් වියදම්.

වැඩිහිටි සුභසාධනය වෙනුවෙන් වු වැඩසටහන් සංවිධානය කිරීම වෙනුවෙන් 2022 වර්ෂය සඳහා රු.මි.0.6 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉන් රු.මි.0.06 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මගින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්.

01. වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,ලියාපදිංචි කිරීම සහ දැනට පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්ගේ නව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් සිදු කර ඇති ඉල්ලීම් අනුව ප්‍රතිපාදන ලබාදීම.

සෑම වැඩිහිටි නිවාසයක්ම ශ්‍රී ලංකා ප්‍රමිති 1506:2015 / වැඩිහිටි උවටැන් නිවාස සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අනුකූල වන පරිද්දෙන් ප්‍රමිතිගත කිරීම හා ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යන වැඩිහිටි නිවාස 10 ක් වෙනුවෙන් නිවාස අළුත්වැඩියාව හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.මි 25.0 ක මුදලක් වෙන් වූ අතර වර්ෂය තුළ රු.මි. 11.96 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

මෙහි දී එක් වැඩිහිටි නිවාසයක් වෙනුවෙන් රුපියල් මිලියන දෙකක උපරිමයකට යටත්ව අරමුදල් ලබාදීම සිදුකරයි. ඉහත ප්‍රමිතියට අදාලව වැඩිහිටි නිවාස ඉදිරියට පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය භෞතික සම්පත් ගොඩනැගීම සඳහා මෙම මුදල් යොමු කෙරේ. ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා අදාල බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීමට අදාලව ඉල්ලුම්පත් කැඳවන අතර ඊට අදාල සුදුසුකම් සහ කොන්දේසි සපුරා ඇති තෝරාගත් වැඩිහිටි නිවාස වෙනුවෙන් මුදල් ලබා දීම (මුදල් ලබාදීමේ කොන්දේසි ඇතුළත්ව) සිදුකරනු ලබයි. මේ සඳහා 2022 වර්ෂය තුළ රු.මි. 100.00 ක් වෙන් වූ අතර වර්ෂය තුළ රු.මි. 19.01 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

02. ශ්‍රවණ උපකරණ ලබා දිම.

ශ්‍රවණ ආබාධයන්ගෙන් පෙළෙන වැඩිහිටියන් උදෙසා ශ්‍රවණ උපකරණ ලබා දීම මෙහිදී සිදුකරන ලදී. මේ සඳහා 2022 වර්ෂය තුළ රු.මි. 5.43 ක මුදලක් වෙන් කර ඇති අතර ඉන් රු.මි. 5.43 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.මෙම වර්ෂය තුළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 123 ක වැඩිහිටියන් 300 දෙනෙකු සඳහා උපකරණ ලබා දී ඇත.

03. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර ලබා දීම.

වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ (මේස,කබඩ් ඇතුළු අනෙකුත්), අළුත් වැඩියා කටයුතු හා නව ඉදිකිරීම් සඳහා (උපරිම රු.මි. 0.5කට යටත්ව) ඉල්ලීම් අනුව ආධාර ලබා දීම මෙහිදී සිදුකරනු ලැබීය.මේ සඳහා වර්ෂය තුළ රු.මි. 175.0 ක ප්‍රතිපාදන වෙන් කළ අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාල 25 ක වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට ආධාර ලබාදෙමින් රු.මි 56.34 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

04. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම.

ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම යටතේ වැඩිහිටි කමිටු ශක්තිමත් කිරීම වෙනුවෙන් ඒ සඳහා අවශ්‍ය උපකරණ හා අවශ්‍ය භාණ්ඩ ආදිය ලබා ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කමිටු වෙත (රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව) මූල්‍ය අනුග්‍රහය ලබා දීම මේ යතේ සිදුවේ.ඒ අනුව 2022 වර්ෂයේ කමිටු 671 ක් වෙත අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දී ඇත.2022 වර්ෂය සඳහා මේ වෙනුවෙන් රු.මි. 99.9 ක් වෙන් වී ඇති අතර රු.මි. 67.43 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

05. උපාය මාර්ගීක සැලැස්ම සකස් කිරීම.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ඉදිරි වසර 05 ක කාලය සඳහා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා 2022 වර්ෂයේ දී රු.මි.0.5 මුදලක් වෙන් කළ අතර,රු.මි.0.32 ක මූල්‍ය ප්‍රගතියක් ලඟා කරගෙන ඇත.

06. වැඩිහිටියන් තම නිවස තුල ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදිම.

වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය (කොමඩ්,ඇඳ,මෙට්ට,අත්වැට,හා නිවසේ අළුත් වැඩියාවන්) සැපයීම වෙනුවෙන් ඉල්ලීම් අනුව එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙනුවෙන් රු.මි. 0.45 ක උපරිමයකට යටත්ව ප්‍රාදේශී ලේකම් කාර්යාල 219 ක පුද්ගලයින් 2518 ට දෙනෙකු සඳහා ආධාර ලබා දීම සිදුකර ඇත.2022 වර්ෂය වෙනුවෙන් රු.මි. 112.25 ක වෙන්වී ඇති ප්‍රතිපාදනයන්ගෙන් රු.මි 112.08 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

07. දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

දිස්ත්‍රික් මට්ටමින් වැඩිහිටි විෂය ආවරණය කරනු ලබන නිළධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම සඳහා 2022 වර්ෂය තුළ දී දිස්ත්‍රික් 25 තුළ රැස්වීම් වාර 25 ක් පැවැත්විම සඳහා වර්ෂය තුළ රු.මි. 1.3 ක ප්‍රතිපාදන වෙන් කර රු.මි. 0.34 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

08. පරිපාලන වියදම්.

සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන් සඳහා වු පරිපාලනමය වියදම් මෙමඟින් දරා ඇත.මේ සඳහා 2022 වර්ෂය වෙනුවෙන් රු.මි. 0.5 ක් වෙන් වු අතර රු.මි.0.02 ක් වියදමක් මෙමඟින් දරා ඇත.

09. පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසය නඩත්තු කටයුතු.

පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසයේ දෛනික කටයුතු සහ සෙසු කටයුතු වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2022 වර්ෂය සඳහා රු.මි. 10.00 ක ප්‍රතිපාදන වෙන් කළ අතර රු.මි. 9.99 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

10. කතරගම නව වැඩිහිටි නිවාසය ඉදිකිරීම.

කතරගම නව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු සඳහා වර්ෂය තුළ රු.මි. 195.0 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් වු අතර, ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි 189.93 ක් ද, පුනරාවර්ථන වියදම් සඳහා රු.මි 1.84 ක වියදමක් ද 2022 වර්ෂයේ දී දරා ඇත.

11. ආරෝග්‍යා සෞඛ්‍ය වැඩසටහන.

2022 වර්ෂයේ ආරම්භ වු මෙම වැඩසටහන යටතේ පිළිකා,වකුගඩු,අංශභාගය,හෘද රෝග යනාදි රෝග සඳහා එක් අයෙකුට එක් වතාවක් පමණක් ලබාදෙන රුපියල් 25,000 ක මූල්‍ය ආධාරයක් ලබාදෙනු ලබයි.වයස අවුරුදු 60 සම්පූර්ණ වී තිබීම අනිවාර්ය වන අතර වෛද්‍ය පරික්ෂණ ,ඖෂධ මිලදී ගැනීම ,ප්‍රවාහන පහසුකම් සැපයීම ආදී කටයුතු සඳහා මෙම ආධාරය පිරිනමනු ලබයි.2022 වර්ෂයේ දී පුද්ගලයින් 996 දෙනෙකුට ආධාර ලබා දෙමින් රු.මි. 24.98 ක මූල්‍ය ප්‍රගතියක් ලබාගත් අතර මේ සඳහා රු.මි. 25.00 ක මුදලක් වෙන් විය.

12. වැඩිහිටි සත්කාරක සේවය.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් වැඩිහිටි නිවාස වල පාලක පාලිකාවන් සඳහා වැඩිහිටි පුහුණු සත්කාරක වැඩසටහනක් මේ යටතේ සිදුකොට ඇත.2022 වර්ෂය දී කළුතර,කෑගල්ල,යාපනය යන දිස්ත්‍රික්ක වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, මේ සඳහා රු.මි.2.00 ක මුදලක් වෙන්කළ අතර එයින් රු.මි 1.52 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

13. ගම්පහ මාරගහලන්ද ඉඩම සංවර්ධනය.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට අයත් ගම්පහ මාරගහලන්ද ඉඩම ආරක්ෂා කිරීම වෙනුවෙන් වැට හා ගේට්ටුව ඉදිකොට සංවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂයේ රු.මි.0.73 ක මුදලක් වෙන් වු අතර රු.මි.0.73 ක මූල්‍ය වියදමක් මෙමඟින් දරා ඇත.

14. දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය.

සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම් පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියාව (එක් නිවාසයක් සඳහා රු.මි.0.3 බැගින්) වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.මි. 25.00 වෙන් කර නිවාස 50 ක් සාදමින් රු.මි.25.00 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

15. විපතට පත් වැඩිහිටි නිවාස සඳහා අධාර ලබාදීම.

කොරෝනා වසංගතය හමුවේ නිවාසගත වැඩිහිටියන් සුරක්ෂිත කිරීම සඳහා නිවාසගත වැඩිහිටියන් හට වියලි ආහාර ද්‍රව්‍ය හා සනිපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම මේ යටතේ සිදුකොට ඇත.මෙ සඳහා 2022 වර්ෂයේ දී රු.මි.2.00 ක මුදලක් වෙන් කළ අතර එයින් රු.මි.0.46 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

16. වන්දනා චාරිකා වැඩසටහන.

අධ්‍යාත්මික සුවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර,ඒ සඳහා රු.මි. 6.50 ක මුදලක් 2022 වර්ෂය සඳහා වෙන් කර වන්දනා චාරිකා 135 ක් දියත් කොට රු.මි. 6.49 ක මූල්‍ය ප්‍රගතියක් අත්කොට ගෙන ඇත.

17. සරණ වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු සිදු කිරීම.

දෙහිඅත්තකණ්ඩිය සරණ වැඩිහිටි නිවාසයේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා එම පාලකයා හට වැටුප් ගෙවීම සඳහා 2022 වර්ෂයේ දී රු.මි. 0.22 මුදලක් වෙන් වූ අතර, රු.මි. 0.22 ක මූල්‍ය ප්‍රගතියක් ඉන් අත් කරගෙන ඇත.

18. වැඩිහිටි රක්ෂණ ආවරණ වැඩසටහන.

පළමු අදියර තුළ රුපියල් 2000 /- දිමනාව ලබන වැඩිහිටි ප්‍රතිලාභින් සඳහා රක්ෂණ ආවරණ ක්‍රමයක් 2022 වර්ෂය දී හඳුන්වා දුන් අතර, ඒ සඳහා මූලික අදියරේ කටයුතු සඳහා රු.මි.0.15 ක් වෙන් කළ අතර, රු.මි. 0.08 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

19. ඩිජිටල් සාක්ෂරතාවය හා අභිප්‍රේරණ රැකියා උත්පාදන වැඩසටහන.

වැඩිහිටියන් හට ඩිජිටල් සාක්ෂරතාවය,යෝග ව්‍යායාම හා ආර්ථික ක්‍රියාවලියට දායක කරලීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ අතර, නියමු ව්‍යාපෘතිය ලෙස දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මූලික කරගෙන වැඩසටහන් 05 දියත් කරනු ලැබීය.2022 වර්ෂයේ දී මේ සඳහා රු.මි. 0.75 ක මුදලක් වෙන් කළ අතර රු.මි. 0.59 ක් මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

20. ග්‍රාමීය වැඩිහිටි කමිටු භාණ්ඩාගාරිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන.

ග්‍රාමීය වැඩිහිටි කමිටු සංවිධාන වල සභාපති,ලේකම් හා භාණ්ඩාගාරිකවරුන් මූල්‍ය විගණනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් මේ යටතේ සිදු කොට ඇත.2022 වර්ෂයේ දී රු.මි. 0.70 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් වූ අතර, ඉන් රු.මි. 0.64 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

21. කතරගම වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු සිදු කිරීම.

කතරගම වැඩිහිටි නිවාසයේ නිවාසගත වැඩිහිටියන් සඳහා දානය ලබාදීම හා සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ දී රු.මි. 0.5 ක මුදලක් වෙන් වූ අතර, ඉන් රු.මි. 0.41 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2022- වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය.

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබා දීම - 2022

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	06
	කොළඹ	07
	ගම්පහ	09
මධ්‍යම	මාතලේ	09
	මහනුවර	13
	නුවරඑළිය	06
දකුණ	ගාල්ල	18
	මාතර	02
	හම්බන්තොට	10
නැගෙනහිර	මඩකලපුව	07
	අම්පාර	09
	ත්‍රිකුණාමලය	02
වයඹ	කුරුණෑගල	13
	පුත්තලම	-
උතුරු මැද	අනුරාධපුරය	22
	පොළොන්නරුව	05
ඌව	බදුල්ල	-
	මොණරාගල	09
සබරගමුව	රත්නපුර	11
	කෑගල්ල	10
උතුර	මන්නාරම	04
	මුලතිව්	06
	වවුනියාව	-
	යාපනය	04
	කිලිනොච්චි	-
එකතුව		**182**

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරිම - 2022

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	3235
	කොළඹ	8319
	ගම්පහ	4164
මධ්‍යම	මාතලේ	1388
	මහනුවර	2984
	නුවරඑළිය	3227
දකුණ	ගාල්ල	3250
	මාතර	1357
	හම්බන්තොට	1046
නැගෙනහිර	මඩකලපුව	889
	අම්පාර	998
	ත්‍රිකුණාමලය	766
වයඹ	කුරුණෑගල	3111
	පුත්තලම	1575
උතුරු මැද	අනුරාධපුරය	1438
	පොළොන්නරුව	1233
ඌව	බදුල්ල	1277
	මොණරාගල	1143
සබරගමුව	රත්නපුර	3914
	කෑගල්ල	2728
උතුර	මන්නාරම	281
	මුලතිව්	225
	වවුනියාව	334
	යාපනය	454
	කිලිනොච්චි	160
එකතුව		**49,496**
ප්‍රධාන කාර්යාලයෙන් ජංගම සේවාවලදි නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව		586
නිකුත් කළ මුළු හැඳුනුම්පත් ගණන		**50,082**

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර,එසේ පරිත්‍යාගශීලින් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250 /- ක මුදලක් හෝ මසකට රුපියල් 500/- බැගින් මුදල් ආධාර ලබාදීමට කටයුතු කර තිබේ.ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේ දී මාස 4කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.1000/- ක මුදලක් හෝ රු.2000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබාදීම සිදු කරනු ඇත.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කීප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලීයාට ද හැකියාව ඇත.එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර,ප්‍රතිලාභියාගේ නම,ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශිලීයා වෙත ලබාදීමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිම සඳහා කැමති අයකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 228075 දරණ “වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය සඳහා වන ජාතික අරමුදල” යන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර,එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය.එසේත් නොමැති නම්,අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2022 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්,ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

අනු අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
01	ඩබ්.එම්.වත්සලා මිය	01	එම්.ජී.වයලට්	තඹුත්තේගම
02	ගිණුම	01	ඩබ්.ජී.ගුණවතී	කුණ්ඩසාලය
03		01	බී.ඩී.ජේන්නෝනා	රිදීගම
04		01	ඩී.එම්.ඩිංගිරි අම්මා	මාස්පොත
05		01	එම්.කේ.ඒ.සෝමා ගුණවර්ධන	මීනුවන්ගොඩ
06		01	අයි.ඇන්සිනෝනා	කැළණිය
07		01	එම්.නෝබට් විමලරත්න	කැස්බෑව
08		01	ඊ.පියසිලි	කඩුවෙල
09		03	ඒ.හේමපාල පෙරේරා	මහරගම
10			ලීලාවතී වීරසිංහ	මහරගම
11			එම්.ඒ.හේමලතා පෙරේරා	මහරගම
12		01	එච්.එම්.හේරත් මැණිකේ	ඉබ්බාගමුව
13		01	ජේ.පී.ලැයිසා	වරකාපොල
14		01	වර්ණපුලිගේ නන්දදාස	සීතාවක
15		01	පස්වැන්නගේ ප්‍රිතිලතා	සීතාවක
16		01	එච්.කුසුම් පෙරේරා	සීතාවක
17		01	ඊ.ජී.ඩිංගිරි බණ්ඩා	දෙල්තොට
18		01	ඒ.ජී.දයාවතී	කෝට්ටේ
එකතුව		**18**		

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2022

මාසය	කාමර වෙන් කළ ප්‍රමාණය	ආදායම රු.	වියදම්	
			ජල බිල්පත් රු.	විදුලි බිල්පත් රු.
ජනවාරි			6,631.20	935.40
පෙබරවාරි			6,058.80	935.40
මාර්තු			10,992.96	2,454.30
අප්‍රේල්				
මැයි				
ජුනි				
ජුලි				
අගෝස්තු				
සැප්තැම්බර්				
ඔක්තෝබර්				
නොවැම්බර්				
දෙසැම්බර්				
එකතුව			**23,682.96**	**4,325.01**

- 2022 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාස වලදී කතරගම සංචාරක නිකේතනයේ අලුත්වැඩියා කටයුතු සිදු වු බැවින් නවාතැන් පහසුකම් ලබා දීමක් සිදු නොවු අතර, අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ කතරගම නව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම හේතුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහා වු ජාතික සභාවේ තීරණය පරිදි කතරගම වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු මෙම සංචාරක නිකේතනය තුළ සිදු කොට ඇත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති සහ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ.වර්තමානයේ මෙහි සභාපති වනුයේ නීතිඥවරියකි.

මෙහි කාර්යභාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති,වයස අවුරුදු 60 ඉක්මවූ,වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය.ඒ අනුව මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී,මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව අදාල පැමිණිලිකරු හා වගඋත්තරකරු යන අය කැඳවා කරුණු විමසා පරික්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි.එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්,යැපීම් අවශ්‍යතා ආදි සියලු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත.තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24(1) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සපයා ඇත.

නමුත්,මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටලු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී නඩත්තු පතනේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී.එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝග නඩත්තු ආඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2022

2022 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි	- 92
විසඳුම් ලබා දුන් පැමිණිලි ගණන	- 61
දැනට විභාගවෙමින් පවතින පැමිණිලි	- 31
පැවැත් වූ රැස්වීම් වාර ගණන	- 43
වියදම් වූ මුදල රු.	– 1,425,500.00

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

ගීතා ද ෆොන්සේකා මිය	සභාපති
එම්.ජී.පුංචි බණ්ඩා මහතා	ලේකම්

මණ්ඩලයේ සාමාජික

1. කේ.බී.රණවීර මයා
2. හේමාල් වීරසිංහ මයා
3. එල්.කේ.ආරියරත්න මයා
4. කාංචන සිල්වා මයා

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රු .	2021 රු .
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ - WDV	02	119,719,624.53	102,968,737.08
කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය	03	189,958,694.93	-
ජංගම වත්කම්			
ස්ථාවර තැන්පතු	04	2,952,533,614.97	2,483,498,750.16
කාර්ය මණ්ඩල ණය	05	7,442,642.00	7,273,127.00
කාර්ය මණ්ඩල අත්තිකාරම්	06	2,500.00	2,500.00
තොගය	07	1,832,089.65	1,071,816.90
වෙනත් ලැබිය යුතු දෑ	08	417,123,686.71	58,779,251.23
මුදල් සහ මුදල් සමාන දෑ	09	14,896,175.16	363,508,955.29
මුළු ජංගම වත්කම්		**3,393,830,708.49**	**2,914,134,400.58**
මුළු වත්කම්		**3,703,509,027.95**	**3,017,103,137.66**
හිමිකම්			
රජයෙන් දායක වූ ප්‍රාග්ධනය	10	24,177,724.85	31,320,644.40
ප්‍රාග්ධන පරිත්‍යාග	11	76,274,600.00	78,268,000.00
ප්‍රත්‍යාගණන සංචිතය	12	40,822,197.28	14,203,010.28
සමුච්චිත අතිරික්තය /(ඌනතාවය)	13	(33,413,331.40)	(33,754,724.67)
මුළු හිමිකම්		**107,861,190.73**	**90,036,930.01**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)	14	34,880,630.00	32,064,667.50
වැඩිහිටි ආරක්ෂක අරමුදල	15	3,557,523,896.48	2,888,661,598.14
වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන	16	4,984.35	12,984.35
මුළු ජංගම **නොවන වගකීම්**		**3,592,409,510.83**	**2,920,739,249.99**
ජංගම වගකීම්			
උපචිත වියදම්	17	375,934.48	644,861.33
පොදු තැන්පතු	18	2,010,391.91	5,406,096.33
වෙන්කිරීම සහ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	19	852,000.00	276,000.00
මුළු ජංගම වගකීම්		**3,238,326.39**	**6,326,957.66**
මුළු හිමිකම් සහ වගකීම්		**3,703,509,027.95**	**3,017,103,137.66**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

පිටු 27 සිට 29 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 30 සිට 37 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභාවේ සාමාජිකයින්ට වගකීම පැවරේ.

යමුනා පෙරේරා
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ
සවිබලගැන්වීම් අමාත්‍යාංශය

කේ.ජී.ලැනරෝල්
ගණන්දීමේ නිලධාරි

අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

යූ.ජී.එල්.මදුසංක
ගණකාධිකාරි

ගණකාධිකාරි
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

යමුනා පෙරේරා
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

ඩී.ටී.සුතර්ෂන්
සාමාජික
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

මහින්ද මඩිහහේවා
සාමාජික
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

28/02/2023
කොළඹ

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රු .	2021 රු .
ආදායම			
රජයෙන් ප්‍රදාන - පුනරාවර්තන	20	158,360,000.00	166,900,000.00
වෙනත් ආදායම්	21	1,809,058.71	1,027,108.76
විලම්බිත ආදායම	22	11,136,319.55	9,585,870.82
මුළු ආදායම		**171,305,378.26**	**177,512,979.58**
අඩු: වියදම්			
වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්	23	20,474,498.91	15,568,541.82
සේවක පිරිවැය	24	104,715,699.36	120,449,831.41
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම	25	11,136,319.55	9,585,870.82
ගමන් වියදම්	26	3,593,953.60	2,835,159.00
සැපයුම්	27	1,977,796.00	2,746,597.17
නඩත්තු වියදම්	28	5,235,956.38	3,292,493.42
කොන්ත්‍රාත් සේවා	29	23,657,473.38	23,698,913.10
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම	30	612,378,89	176,650.00
පුහුණුව සහ ධාරිතා වර්ධන		115,000.00	-
මුළු වියදම්		**171,519,076.07**	**178,354,056.74**
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)		**(213,697.81)**	**(841,077.16)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

විස්තරය	ප්‍රාග්ධනය දායකය		ප්‍රාග්ධන පරිත්‍යාග රු .	ප්‍රත්‍යාගණන සංචිතය රු .	සමුච්චිත අතිරික්තය රු .
	ප්‍රාග්ධන අග්‍රිමය රු .	ප්‍රාග්ධන දීමනා රු .			
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**32,025,840.22**	**6,210,625.00**	**80,261,400.00**	**324,615.28**	**(35,186,151.44)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	-	1,951,624.58
වර්ෂය තුළ ගැලපීම	(3,968,195.82)	(2,947,625.00)	(1,993,400.00)	13,878,395.00	320,879.35
වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	(841,077.16)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,057,644.40**	**3,263,000.00**	**78,268,000.00**	**14,203,010.28**	**(33,754,724.67)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	-	-
වර්ෂය තුළ ගැලපීම	(3,515,919.55)	(3,627,000.00)	(1,993,400.00)	26,619,187.00	555,091.08
වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	(213,697.81)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**24,541,724.85**	**(364,000.00)**	**76,274,600.00**	**40,822,197.28**	**(33,413,331.40)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු .	2021 රු .
අතිරික්තය / (ඌනතාවය) බදු ගෙවීමට පෙර	**(213,697.81)**	**(841,077.16)**
ගැලපීම්		
විලම්බිත ආදායම	(11,136,319.55)	(9,585,870.82)
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම	11,136,319.55	9,585,870.82
ප්‍රතිපාදන / (ආපසු හරවන ලද) පාරිතෝෂිකය	2,943,972.50	3,121,472.50
පෙර වර්ෂ ගැලපුම් ගිණුම	-	1,951,624.58
වර්ෂය තුළ ගැලපීම	555,091.08	320,879.35
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර	**3,285,365.77**	**4,552,899.27**
ආයෝජන අඩුවීම (වැඩිවීම)/ (ස්ථාවර තැන්පතු)	(469,034,864.81)	(463,721,878.95)
තොග (වැඩිවීම)/ අඩුවීම	(760,272.75)	(188,482.14)
කාර්ය මණ්ඩල ණය (වැඩිවීම) /අඩුවීම	(169,515.00)	(340,014.00)
කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	-	43,450.00
අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම	(358,344,435.48)	(15,709,134.71)
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩිවීම/ (අඩුවීම).	576,000.00	(276,000.00)
කාර්ය මණ්ඩල ණය අරමුදලේ වැඩිවීම /(අඩු වීම).	-	(1,951,624.58)
පොදු තැන්පතු වැඩිවීම /(අඩුවීම).	(3,395,704.42)	1,833,804.10
උපචිත වියදම් වැඩිවීම /(අඩු වීම).	(268,926.85)	(8,520,446.87)
මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(828,112,353.54)**	**(484,277,427.88)**
පාරිතෝෂික ගෙවීම්	(128,010.00)	(198,022.50)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**(828,240,363.54)**	**(484,475,450.38)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(1,268,020.00)	(484,662.50)
කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය	(189,958,694.93)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(191,226,714.93)**	**(484,662.50)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රදානය (ප්‍රාග්ධනය)	2,000,000.00	676,650.00
වැඩිහිටි ආවරණ කැපකරු යෝජනා ක්‍රමය	(8,000.00)	(14,000.00)
වැඩිහිටි ආරක්ෂණ අරමුදල	668,862,298.34	441,723,420.67
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) මූල්‍ය ක්‍රියාකාරකම්වලින්	**670,854,298.34**	**442,386,070.67**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ (අඩු වීම)/ වැඩිවීම	(348,612,780.13)	(42,574,042.21)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	363,508,955.29	406,082,997.50
වර්ෂය **අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ**	**14,896,175.16**	**363,508,955.29**
මුදල් සහ මුදල් සමානතා සැසඳීම		
වර්ෂය **අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ**	**14,896,175.16**	**363,508,955.29**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පිහිටුවීම හා නීතිමය තත්ත්වය

2011 අංක 05 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි අයිතිවාසිකම් සුරකීමේ පනත යටතේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය පිහිටුවන ලද අතර එය විධිමත් ලෙස නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිහිටුවන ලදී. වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSE) ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියර, 2 වන මහලෙහි, ඩී කොටසහි පිහිටා ඇත.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ හා ජාතික මට්ටමේ පරිපාලන රාජ්‍ය ආයතනය වේ.

1.2. පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) සහ මුදල් අමාත්‍යාංශය එක්ව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය අංශයේ ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) සහ 2000 අංක 09 දරණ වැඩිහිටි අයිතිවාසිකම් සුරකීමේ පනතේ IV වැනි වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා අනුව මෙම ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් පදනම

විශේෂයෙන් සඳහන් කර නොමැති නම් මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

නුදුරු අනාගතයේ දී එහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ලේකම් කාර්යාලය සතුව ඇති බව කවුන්සිලයේ සාමාජිකයින් සෑහීමකට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙනය.

1.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

විශේෂයෙන් සඳහන් නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. විදේශ මුදල් ගණුදෙණුව පලමුව සටහන් වන්නේ ගනුදෙනුව සිදු වූ දිනයේ පවතින ක්‍රියාකාරී මුදල් අනුපාතිකයටය.

(ආ) දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකර ප්‍රකාශ කර ඇත.

පසුකාලීන වියදම්

ප්‍රධාන පරීක්ෂණ සහ ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන ලද දේපල, පිරියත සහ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපල, පිරියත සහ උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය මත පදනම්ව, වාර්ෂිකව පහත සඳහන් අනුපාත භාවිතා කරමින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කෙරේ. මිලදී ගත් වර්ෂය සඳහා තවදුරටත් ක්ෂයවීම් සම්පූර්ණයෙන්ම ගණනය කරන ලද අතර ඉවත් කිරීමේදී ක්ෂයවීම ගණනය කරනු නොලැබේ.

ගොඩනැගිලි	4%
මෝටර් වාහන	10%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15%
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	20%

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, එවැනි වෙනස්කම් පිළිබිඹු කිරීමට එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර වෙනස්කම් සිදු කරනු ලැබේ.

හානිකරණ

ධාරණ අගය ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය හානිකරණ සඳහා සමාලෝචනය කෙරේ. වත්කම්වල ධාරණ අගය ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම්, වත්කම්වල ධාරණ අගය වහාම එහි ආපසු ලබාගත හැකි මුදලට ලියා හැර ඇත.

(ඇ) ආයෝජන

මෙම ආයෝජන ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු වලින් සමන්විත වේ. මෙම ස්ථාවර තැන්පතු පිරිවැයට ගිණුම්ගත කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට උපචිත පොළිය ලැබිය යුතු පොලී ලෙස දැක්වේ.

(ඈ) තොග

තොගය, ලිපිද්‍රව්‍ය තොග සහ කාර්යාල අවශ්‍යතා වලින් සමන්විත වේ. ඒවා පිරිවැයට දක්වා ඇත.

(ඉ) ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නැවත අයකර ගත හැකි අගයකින් ගෙන යනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ . අයකරගත නොහැකි බව දන්නා ණය ඒවා හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

(ඊ) මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු වෙනුවෙන්, බැංකුවේ ඇති මුදල්, අතේ ඇති මුදල්, මාස තුනකට අඩු කල්පිරීමක් ඇති බැංකු වල ස්ථාවර තැන්පතුවලින් මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වේ

(උ) වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය මත ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ලේකම් කාර්යාලයට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත.

(ඌ) සේවක ප්‍රතිලාභ

අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්

ලේකම් කාර්යාලයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර ආයතනය එම සේවකයින්ගේ මූලික වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙලින් 12% සහ 3% දායක වේ.

(එ) ආදායම් හඳුනා ගැනීම

i. **ශ්‍රී ලංකා රජයේ දායකත්වය**

ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමක් මත පිළිගැනේ. එය ලේකම් කාර්යාලයේ වියදම් පියවීමේ පදනම මත පුනරාවර්තන සහ ප්‍රාග්ධන දීමනා ලෙස වෙන් කර ඇත.

ii. **පොලී ආදායම**

පොලී ආදායම කාලය පදනම් කරගෙන උපචිත පදනම මත ගණනය කෙරේ.

(ඒ) ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

සේවා පවත්වාගෙන යාම සඳහා හෝ ආයතනයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

02 . දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය - 2022					
විස්තරය	ආරම්භක ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	කපාහැරීම්	අවසාන ශේෂය
ඉඩම්	38,400,000.00	-	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	-	50,880,552.92
වාහන	29,476,250.00	-	20,300,000.00	(13,506,250.00)	36,270,000.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ.	11,559,040.59	-	8,232,312.00	(4,503,547.86)	15,287,804.73
පිරියත සහ යන්ත්‍රෝපකරණ	15,471,725.00	1,268,020.00	290,000.00	(180,032.50)	16,849,712.50
	145,787,568.51	**1,268,020.00**	**28,822,312.00**	**(18,189,830.36)**	**157,688,070.15**

ක්ෂයවීම් - 2022				
විස්තරය	ආරම්භක ශේෂය	ක්ෂයවීම්	කපාහැරීම්	අවසාන ශේෂය
ගොඩනැගිලි	9,961,362.22	2,035,222.12	-	11,996,584.33
වාහන	16,306,500.00	3,627,000.00	(11,303,125.00)	8,630,375.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	9,321,666.06	2,104,154.93	(4,503,547.86)	6,922,273.14
පිරියත සහ යන්ත්‍රෝපකරණ	7,229,303.15	3,369,942.50	(180,032.50)	10,419,213.15
	42,818,831.43	**11,136,319.55**	**(15,986,705.36)**	**37,968,445.62**

පිරිවැය - 2021					
විස්තරය	ආරම්භක ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	කපාහැරීම්	අවසාන ශේෂය
ඉඩම්	38,400,000.00	-	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	-	50,880,552.92
වාහන	29,651,250.00	-	4,675,000.00	(4,850,000.00)	29,476,250.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	14,728,917.08	289,262.50	1,229,754.00	(4,688,892.99)	11,559,040.59
පිරියත සහ යන්ත්‍රෝපකරණ	18,733,223.25	195,400.00	7,973,641.00	(11,430,539.25)	15,471,725.00
	152,393,943.25	**484,662.50**	**13,878,395.00**	**(20,969,432.24)**	**145,787,568.51**

ක්ෂයවීම් - 2021				
විස්තරය	ආරම්භක ශේෂය	ක්ෂයවීම්	කපාහැරීම්	අවසාන ශේෂය
ගොඩනැගිලි	7,926,140.10	2,035,222.12	-	9,961,362.22
වාහන	18,208,875.00	2,947,625.00	(4,850,000.00)	16,306,500.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	12,501,880.35	1,508,678.70	(4,688,892.99)	9,321,666.06
පිරියත සහ යන්ත්‍රෝපකරණ	15,565,497.40	3,094,345.00	(11,430,539.25)	7,229,303.15
	54,202,392.85	**9,585,870.82**	**(20,969,432.24)**	**42,818,831.43**

03 . කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය

	2022	2021
ඉදිකිරීම් ගෙවීම් - සීමාසහිත පීඩීපී ඉංජිනේරු පුද්ගලික සමාගම	173,855,241.23	-
උපදේශන ගෙවීම් - මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය	12,821,543.62	-
සැලසුම් අනුමත කිරීමේ ගාස්තු - නාගරික සංවර්ධන අධිකාරිය	154,786.04	-
විදුලි සම්බන්ධතා ගාස්තු - ලංකා විදුලිබල මණ්ඩලය	2,851,411.54	-
මලාපවහන ගාස්තු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	275,712.50	-
එකතුව	**189,958,694.93**	**-**

04 . ස්ථාවර තැන්පතු

බැංකුව	ගිණුම් අංකය	2022	2021
ලංකා බැංකුව	88226543	10,832,186.73	9,697,329.32
ලංකා බැංකුව	89202965 / 87638575	816,839,904.59	763,564,994.03
ලංකා බැංකුව	89251242 / 87695248	367,494,733.64	342,710,115.58
ලංකා බැංකුව	88906968 / 88067250	527,821,956.39	506,473,741.30
ලංකා බැංකුව	89438922 / 87389279	375,000,000.00	350,000,000.00
මහජන බැංකුව	27835-0	-	57,572,045.42
මහජන බැංකුව	33802-7 / 26953-8	88,740,995.03	81,844,315.24
මහජන බැංකුව	32091-9 / 28999-0	84,951,865.56	81,693,094.45
මහජන බැංකුව	35337-9	314,518,356.16	-
මහජන බැංකුව / ජාතික ඉතිරිකිරීමේ බැංකුව	33803-6 / 35786	178,760,601.72	164,893,039.47
මහජන බැංකුව / ජාතික ඉතිරිකිරීමේ බැංකුව	34302-0 / 37550	137,573,015.15	125,050,075.35
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	03285	50,000,000.00	-
එකතුව		**2,952,533,614.97**	**2,483,498,750.16**

05 . කාර්ය මණ්ඩල ණය

	2022	2021
ආරම්භක ශේෂය	**7,273,127.00**	**6,933,113.00**
වර්ෂය තුළ නිකුත් කළ ණය	2,278,150.00	2,634,280.00
අඩු: වර්ෂය තුළ ලැබුණු වාරික	(2,108,635.00)	(2,294,266.00)
එකතුව (උපලේඛන අංක 01 බලන්න)	**7,442,642.00**	**7,273,127.00**

06 . කාර්ය මණ්ඩල අත්තිකාරම්

	2022	2021
උත්සව අත්තිකාරම්	2,500.00	2,500.00
එකතුව (උපලේඛන අංක 02 බලන්න)	**2,500.00**	**2,500.00**

07 . තොග (උපලේඛන අංක 03 බලන්න)

08 . වෙනත් ලැබිය යුතු දෑ

	2022	2021
වැඩිහිටි දීමනාවෙන් රු. 100/= අඩු කිරීම	72,910,400.00	-
ස්ථාවර තැන්පතු සඳහා පොලී	344,213,286.71	58,779,251.23
එකතුව	**417,123,686.71**	**58,779,251.23**

09 . මුදල් සහ මුදල් සමාන දෑ

	2022	2021
ගිණුම් අංක 5234881 හි මුදල් ශේෂය	6,137,004.81	7,572,047.97
ගිණුම් අංක 9179076 හි මුදල් ශේෂය	223,071.30	90,251.93
ගිණුම් අංක 228075 හි මුදල් ශේෂය	8,536,099.05	355,846,655.39
එකතුව	**14,896,175.16**	**363,508,955.29**

10 . රජයෙන් දායක වූ ප්‍රාග්ධනය

	2022	2021
ආරම්භක ශේෂය	**83,007,395.29**	**82,330,745.29**
රජයෙන් ප්‍රදානය - ප්‍රාග්ධනය	2,000,000.00	676,650.00
	85,007,395.29	**83,007,395.29**
අඩු: විලම්බිත ආදායම - 2016	(9,630,951.51)	(9,630,951.51)
අඩු: විලම්බිත ආදායම - 2017	(8,056,724.59)	(8,056,724.59)
අඩු: විලම්බිත ආදායම - 2018	(9,320,240.55)	(9,320,240.55)
අඩු: විලම්බිත ආදායම - 2019	(9,011,080.84)	(9,011,080.84)
අඩු: විලම්බිත ආදායම - 2020	(8,075,282.58)	(8,075,282.58)
අඩු: විලම්බිත ආදායම - 2021	(7,592,470.82)	(7,592,470.82)
අඩු: විලම්බිත ආදායම - 2022	(9,142,919.55)	-
අවසන් ශේෂය	**24,177,724.85**	**31,320,644.40**

11 . ප්‍රාග්ධන පරිත්‍යාග

	2022	2021
මල්වතු හිරිපිටිය ඉඩම	4,200,000.00	4,200,000.00
මාරගහලන්ද ඉඩම	13,000,000.00	13,000,000.00
කතරගම ඉඩම	18,000,000.00	18,000,000.00
හාරගම ඉඩම	3,200,000.00	3,200,000.00
මාලිගාතැන්න වැඩිහිටි නිවාසය	16,122,000.00	16,122,000.00
කතරගම වැඩිහිටි නිවාසය	33,713,000.00	33,713,000.00
	88,235,000.00	**88,235,000.00**
අඩු: විලම්බිත ආදායම - 2017	(1,993,400.00)	(1,993,400.00)
අඩු: විලම්බිත ආදායම - 2018	(1,993,400.00)	(1,993,400.00)
අඩු: විලම්බිත ආදායම - 2019	(1,993,400.00)	(1,993,400.00)
අඩු: විලම්බිත ආදායම - 2020	(1,993,400.00)	(1,993,400.00)
අඩු: විලම්බිත ආදායම - 2021	(1,993,400.00)	(1,993,400.00)
අඩු: විලම්බිත ආදායම - 2022	(1,993,400.00)	-
අවසන් ශේෂය	**76,274,600.00**	**78,268,000.00**

12. පත්‍යාගණන සංචිතය

	2022	2021
ආරම්භක ශේෂය	**14,203,010.28**	**324,615.28**
නැවත තක්සේරු කිරීම අතිරික්තය/ඌනතාවය	26,619,187.00	13,878,395.00
අවසන් ශේෂය	**40,822,197.28**	**14,203,010.28**

13 . සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)

	2022	2021
ආරම්භක ශේෂය	**(33,754,724.67)**	(35,186,151.44)
පෙර වසරේ ගැලපීම	-	1,951,624.58
වර්ෂය තුළ ගැලපීම	555,091.08	320,879.35
වර්ෂය සඳහා අතිරික්ත/ **(ඌනතාවය)**	(213,697.81)	(841,077.16)
අවසන් ශේෂය	**(33,413,331.40)**	**(33,754,724.67)**

14 සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)

	2022	2021
ආරම්භක ශේෂය	**32,064,667.50**	**29,141,217.50**
අඩු: විශ්‍රාමික නිලධාරීන්ට ගෙවීම	(128,010.00)	(198,022.50)
වර්ෂය සඳහා වෙන් කිරීම්	2,943,972.50	3,121,472.50
අවසන් ශේෂය (උපලේඛන අංක 04 බලන්න)	**34,880,630.00**	**32,064,667.50**

15. වැඩිහිටි ආරක්ෂණ අරමුදල

	2022	2021
ආරම්භක ශේෂය	**2,888,661,598.14**	**2,446,938,177.47**
වැඩිහිටි දීමනාවෙන් රු. 100/= අඩු කිරීම	546,423,700.00	461,913,099.77
ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී ආදායම	466,855,899.66	129,656,681.91
	3,901,941,197.80	**3,038,507,959.15**
අඩු: වියදම **(උපලේඛන අංක 05 බලන්න)**	(344,417,301.32)	(149,846,361.01)
අවසන් ශේෂය	**3,557,523,896.48**	**2,888,661,598.14**

16. වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

	2022	2021
ආරම්භක ශේෂය	**12,984.35**	**26,984.35**
මුළු ලැබීම්	47,000.00	76,000.00
	59,984.35	**102,984.35**
අඩු: ගෙවීම්	(55,000.00)	(90,000.00)
අවසන් ශේෂය	**4,984.35**	**12,984.35**

17. උපචිත වියදම්

	2022	2021
හඳුනා ගැනීම සහ වරප්‍රසාද සේවා සැපයීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම	-	3,316.00
වඩා හොඳ සේවාවක් සඳහා වැඩිහිටි නිවාස ප්‍රමිතිකරණය, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය සහ ලියාපදිංචි කිරීම	-	973.70
පරිපාලනය, අධීක්ෂණය සහ ඇගයීම	-	7,627.00
සේවක පිරිවැය	23,131.00	31,779.00
ගමන් වියදම්	173,105.00	435,698.00
සැපයුම්	-	11,859.00
සේවාවන්	179,698.48	153,608.63
එකතුව	**375,934.48**	**644,861.33**

18 . පොදු තැන්පතු

	2022	2021
ආරම්භක ශේෂය	**5,406,096.33**	**3,572,292.23**
මුළු ලැබීම්	872,793.15	13,633,667.71
	6,278,889.48	**17,205,959.94**
අඩු: ගෙවීම්	(4,268,497.57)	(11,799,863.61)
අවසන් ශේෂය	**2,010,391.91**	**5,406,096.33**

19 . වෙන්කිරීම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

විගණන ගාස්තු	2022	2021
ආරම්භක ශේෂය	**276,000.00**	**552,000.00**
අඩු: ගාස්තු ගෙවීම්	-	(828,000.00)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	576,000.00	552,000.00
අවසන් ශේෂය	**852,000.00**	**276,000.00**

20 . රජයේ ප්‍රදාන - පුනරාවර්තන

	2022	2021
වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්	26,840,000.00	16,475,000.00
ආයතන වියදම්	131,520,000.00	150,425,000.00
එකතුව	**158,360,000.00**	**166,900,000.00**

21 . වෙනත් ආදායම්

	2022	2021
ස්ථාවර තැන්පතු සඳහා පොලිය (ගි.අ - 88226543)	1,173,140.54	720,899.35
සංචාරක බංගලා ආදායම	-	5,875.00
කාර්ය මණ්ඩල ණය සඳහා පොලී	302,334.37	283,573.21
විශේෂ අත්තිකාරම් පොලී	2,348.80	1,321.20
අපහරණ අයිතම	326,610.00	13,340.00
වාහන භාවිතය සඳහා කුලී	4,200.00	2,100.00
වෙනත්	425.00	-
එකතුව	**1,809,058.71**	**1,027,108.76**

22 . විලම්බිත ආදායම

	2022	2021
ගොඩනැගිල්ල සඳහා ක්ෂය වීම	2,035,222.12	2,035,222.12
වාහන සඳහා ක්ෂය වීම	3,627,000.00	2,947,625.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂය වීම	2,104,154.93	1,508,678.70
පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂය වීම	3,369,942.50	3,094,345.00
එකතුව	**11,136,319.55**	**9,585,870.82**

23 . වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්

	2022	2021
ගම් මට්ටමේ කමිටු පිහිටුවීම	1,327,567.50	-
පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	482,700.00	55,541.50
හඳුනා ගැනීම සහ වරප්‍රසාද සේවා සැපයීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම	2,155,168.00	448,611.00
වැඩිහිටියන් සඳහා වෛද්‍ය ආධාර	-	32,200.00
වඩා හොඳ සේවාවක් සඳහා වැඩිහිටි නිවාස ප්‍රමිතිකරණය, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය සහ ලියාපදිංචි කිරීම	1,539,973.28	1,340,034.96
ස්වයං රැකියා ආධාර	5,220,493.00	2,743,950.00
වැඩිහිටියන් සඳහා නීතිමය පහසුකම් සැපයීම	2,976,272.00	2,214,166.00
පරිපාලනය, අධීක්ෂණය සහ ඇගයීම	5,153,057.29	6,802,812.50
මාධ්‍ය සහ ප්‍රකාශන	1,373,125.84	939,922.50
ජාත්‍යන්තර වැඩිහිටි දිනය	178,942.00	946,303.36
වෙනත් වියදම්	67,200.00	45,000.00
එකතුව	**20,474,498.91**	**15,568,541.82**

24 . සේවක පිරිවැය

	2022	2021
වැටුප් සහ වේතන	65,068,147.51	83,135,143.08
අතිකාල සහ නිවාඩු ගෙවීම්	675,456.41	797,345.08
වෙනත් දීමනා	26,290,686.28	23,922,658.51
සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය	7,789,949.30	7,578,569.78
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වය	1,947,487.36	1,894,642.46
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	2,943,972.50	3,121,472.50
එකතුව	**104,715,699.36**	**120,449,831.41**

25 . දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම

	2022	2021
ගොඩනැගිලි	2,035,222.12	2,035,222.12
වාහන	3,627,000.00	2,947,625.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	2,104,154.93	1,508,678.70
පිරියත හා යන්ත්‍රෝපකරණ	3,369,942.50	3,094,345.00
එකතුව	**11,136,319.55**	**9,585,870.82**

26 . ගමන් වියදම්

	2022	2021
දේශීය	2,811,013.00	2,835,159.00
විදේශීය	782,940.60	-
එකතුව	**3,593,953.60**	**2,835,159.00**

27 . සැපයුම්

	2022	2021
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	1,007,815.25	1,444,453.37
ඉන්ධන	850,485.00	1,196,808.80
ආහාර සහ නිල ඇඳුම්	20,000.00	20,000.00
වෙනත්	99,495.75	85,335.00
එකතුව	**1,977,796.00**	**2,746,597.17**

28 . නඩත්තු වියදම්

	2022	2021
වාහන	4,447,281.73	2,498,531.96
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	788,674.65	793,961.46
එකතුව	**5,235,956.38**	**3,292,493.42**

29 . සේවාවන්

	2022	2021
ප්‍රවාහන	626,008.00	313,326.00
තැපැල් හා විදුලි සංදේශ	1,039,869.61	822,229.03
විදුලිය සහ ජලය	1,221,878.24	1,126,654.67
කුලී	19,394,821.82	20,483,071.60
වෙනත්	798,895.71	401,631.80
විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්	576,000.00	552,000.00
එකතුව	**23,657,473.38**	**23,698,913.10**

30 . ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම

	2022	2021
ප්‍රතිසංස්කරණ වියදම් - කතරගම සංචාරක බංගලාව	612,378.89	151,650.00
මැනුම් සැලැස්ම සකස් කිරීම - මාරගහලන්ද ඉඩම	-	25,000.00
එකතුව	**612,378.89**	**176,650.00**

31 . කල්බදු බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව කල්බදු බැඳීම් නොමැත.

32 . ප්‍රාග්ධන බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව ප්‍රාග්ධන බැඳීම් නොමැත.

33 . සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නොමැත.

34 . අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව **අසම්භාව්‍ය** බැරකම් නොමැත.

35 . මූල්‍ය තත්ත්ව **ප්‍රකාශන දිනට පසු සිදුවන සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම් කිසිවක් සිදු නොවීය.

36 . සංසන්දනාත්මක සංඛ්‍යා

ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා අවශ්‍ය තැන්වල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සඳහන් කර ඇත.

37 . සභා සාමාජිකයින්ගේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභා සාමාජිකයින්ගේ වගකීම වේ.

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය	02	189,958,694.93	-
ජංගම වත්කම්			
ස්ථාවර තැන්පතු	03	2,941,701,428.24	2,473,801,420.84
ලැබිය යුතු පොලී	04	344,138,871.07	58,743,118.72
රු.100/= අඩුකළ ලැබිය යුතු මුදල්		72,910,400.00	-
මුදල් සහ මුදල් සමාන දෑ	05	8,536,099.05	355,846,655.39
මුළු ජංගම වත්කම්		**3,367,286,798.36**	**2,888,391,194.95**
මුළු වත්කම්		**3,557,245,493.29**	**2,888,391,194.95**
හිමිකම්			
වැඩිහිටි දීමනාවෙන් රු.100/= අඩු කිරීම	06	3,372,576,500.00	2,826,152,800.00
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)	07	184,238,008.94	62,087,410.60
මුළු හිමිකම්		**3,556,814,508.94**	**2,888,240,210.60**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන	08	4,984.35	12,984.35
මුළු **ජංගම** නොවන වගකීම්		**4,984.35**	**12,984.35**
ජංගම වගකීම්			
වෙන්කිරීම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	09	426,000.00	138,000.00
මුළු **ජංගම** වගකීම්		**426,000.00**	**138,000.00**
සම්පූර්ණ හිමිකම් සහ වගකීම්		**3,557,245,493.29**	**2,888,391,194.95**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

පිටු 43 සිට 45 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 46 සිට 48 දක්වා පිටු වල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම සභාවේ සාමාජිකයින් දරනු ලැබේ.

යමුනා පෙරේරා
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ
සවිබලගැන්වීම් අමාත්‍යාංශය

කේ.ජී.ලැනරෝල්
ගණන්දීමේ නිලධාරි

අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

යූ.ජී.එල්.මදුසංක
ගණකාධිකාරි

ගණකාධිකාරී
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

යමුනා පෙරේරා
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

ඩී.ටි.සුතර්ෂන්
සාමාජික
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

මහින්ද මඩිහහේවා
සාමාජික
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

28/02/2023
කොළඹ

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රු.	2021 රු.
ආදායම			
පොලී ආදායම	10	466,855,899.66	129,656,681.91
		466,855,899.66	**129,656,681.91**
අඩුකළා: වියදම්			
උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම		316,100.00	-
"ආරෝග්‍යා" සෞඛ්‍ය පාදක ව්‍යාපෘතිය		24,975,000.00	9,928,410.00
වැඩිහිටියන් සඳහා ශ්‍රවණාධාර ලබා දීම		5,430,000.00	11,226,946.00
වැඩිහිටි සත්කාරක වැඩසටහන		1,524,351.50	-
වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සහ පරිපාලනය - පන්නල		9,999,272.63	5,500,000.00
නව වැඩිහිටි නිවාසයක් ඉදිකිරීම - කතරගම		1,839,214.09	(124,181.00)
"දිවියට සවියක්" ව්‍යාපෘතිය		-	(40,954.00)
වැඩිහිටි නිවාස ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම		19,005,572.33	7,601,437.50
වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම		56,336,506.26	-
"දිරිය පියස" නිවාස ව්‍යාපෘතිය		25,000,000.00	13,800,000.00
සුවපහසු මූල්‍ය ව්‍යාපෘතිය		112,079,102.67	70,263,408.38
වැඩිහිටි කමිටු සඳහා වන්දනා චාරිකා වැඩසටහන් සැපයීම		6,499,680.00	-
ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු ශක්තිමත් කිරීම		67,433,418.48	15,658,208.16
වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා උපකරණ සැපයීම		11,956,772.00	18,845,767.85
වසංගත හෝ හදිසි අවස්ථා සඳහා ආධාර සැපයීම		459,178.00	982,885.00
වැඩිහිටි තැනැත්තන් සඳහා උපකාරක සේවාව		-	-
ප්‍රගති සමාලෝචන රැස්වීම්		336,670.00	261,325.00
පරිපාලන වියදම්		21,874.25	338,197.50
NSE ව්‍යාපෘතිය සඳහා මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරය		-	847,800.00
"සරණ වැඩිහිටි නිවාසය" පරිපාලනය		220,000.00	-
වැඩිහිටි රක්ෂණ වැඩසටහන		86,780.00	-
"මාරගහලන්ද" ඉඩම පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම		733,580.80	562,158.50
දිවා මධ්‍යස්ථානවල වැඩිහිටියන් සඳහා ඩිජිටල් සහ යෝග පුහුණු වැඩසටහන		596,235.00	-
ග්‍රාමීය වැඩිහිටි කමිටුවල භාණ්ඩාගාරිකයන් සඳහා පුහුණු වැඩසටහන්		637,550.00	-
වයස අවුරුදු 100ට වැඩි වැඩිහිටියන් සඳහා මූල්‍ය ආධාර (පොරොත්තු ලේඛනය)		-	350,000.00
"කතරගම වැඩිහිටි නිවාසය" පරිපාලනය		408,587.00	-
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		288,000.00	276,000.00
මුළු වියදම්		**346,183,445.01**	**156,277,408.89**
වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය).		**120,672,454.65**	**(26,620,726.98)**

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

විස්තරය	වැඩිහිටි දීමනාවෙන් රු. 100/= අඩු කිරීම රු.	සමුච්චිත අතිරික්තය රු.
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,364,239,700.23**	**82,553,089.70**
පෙර වර්ෂ ගැලපීම	-	-
වර්ෂය තුළ ගැලපීම	461,913,099.77	6,155,047.88
වර්ෂය සඳහා අතිරික්තය /(**ඌනතාවය)**	-	(26,620,726.98)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,826,152,800.00**	**62,087,410.60**
පෙර වර්ෂ ගැලපීම	-	-
වර්ෂය තුළ ගැලපීම	546,423,700.00	1,478,143.69
වර්ෂය සඳහා අතිරික්තය/ **ඌනතාවය**	-	120,672,454.65
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,372,576,500.00**	**184,238,008.94**

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
අතිරික්තය / (ඌනතාවය) බදු ගෙවීමට පෙර	**120,672,454.65**	**(26,620,726.98)**
ගැලපීම්		
වර්ෂය තුළ ගැලපීම	1,478,143.69	6,155,047.88
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර	**122,150,598.34**	**(20,465,679.10)**
ආයෝජන (වැඩිවීම) / අඩුවීම (ස්ථාවර තැන්පතු)	(467,900,007.40)	(463,759,083.05)
ලැබිය යුතු පොලී (වැඩිවීම) /අඩුවීම	(285,395,752.35)	(15,361,914.51)
රු. 100/= අඩුකිරීම් ලැබිය යුතු මුදල් (වැඩිවීම) /අඩුවීම	(72,910,400.00)	-
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩිවීම /(අඩුවීම).	288,000.00	(232,700.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(703,767,561.41)**	**(499,819,376.66)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**(703,767,561.41)**	**(499,819,376.66)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය	(189,958,694.93)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**(189,958,694.93)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
වැඩිහිටි ආවරණ අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය	(8,000.00)	(14,000.00)
වැඩිහිටි දීමනාවෙන් රු.100/= අඩු කිරීම	546,423,700.00	461,913,099.77
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**546,415,700.00**	**461,899,099.77**
මුදල් සහ මුදල් සමාන අගයන් හි ශුද්ධ (අඩුවීම)/ වැඩිවීම	(347,310,556.34)	(37,920,276.89)
ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	355,846,655.39	393,766,932.28
වර්ෂය **අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ**	**8,536,099.05**	**355,846,655.39**
මුදල් සහ මුදල් සමාන දෑ සැසඳුම		
වර්ෂය **අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ**	**8,536,099.05**	**355,846,655.39**

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

1. පිහිටුවීම හා නීතිමය තත්ත්වය

2011 අංක 05 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය පිහිටුවන ලද අතර එය විධිමත් ලෙස නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිහිටුවන ලදී. වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSE) ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියර, 2 වන මහලෙහි, ඩී කොටසහි පිහිටා ඇත.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි පුද්ගලයින්ගේ සුබසාධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ හා ජාතික මට්ටමේ පරිපාලන රාජ්‍ය ආයතනය වේ.

1.2 පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වලින් සමන්විත වේ.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) සහ මුදල් අමාත්‍යාංශය එක්ව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය අංශයේ ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) සහ 2000 අංක 09 දරණ වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනතේ IV වැනි වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා අනුව මෙම ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

නුදුරු අනාගතයේ දී එහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ලේකම් කාර්යාලය සතුව ඇති බව සභාවේ සාමාජිකයින් සෑහීමකට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඉදිරියට **අඛණ්ඩ පැවැත්ම** පදනම් කරගෙනය.

1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු.

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. විදේශ මුදල් වල ගණුදෙණුව මුලින් සටහන් වන්නේ ගනුදෙනුව සිදු වූ දිනයේ පවතින ක්‍රියාකාරී මුදල් අනුපාතිකයටය.

(ආ) දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැය හෝ සමුච්චිත ක්ෂයවීම් අඩු කර නැවත අගය කළ මුදලට ප්‍රකාශ කර ඇත.

පසුකාලීන වියදම්

ප්‍රධාන පරීක්ෂා සහ ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන ලද දේපල, පිරියත සහ උපකරණ අයිතමයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමට දරන ලද වියදම් ප්‍රාග්ධනීකරණය වේ. අනෙකුත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපල, පිරියත සහ උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය මත පදනම්ව, වාර්ෂිකව පහත දැක්වෙන අනුපාත භාවිතා කරමින් සරල රේඛා ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කෙරේ. මිලදී ගත් වර්ෂය සඳහා තවදුරටත් ක්ෂයවීම් සම්පූර්ණයෙන්ම ගණනය කරන ලද අතර ඉවත් කිරීමේ දී ක්ෂය ගණනය කරනු නොලැබේ.

ගොඩනැගිලි	4%
මෝටර් වාහන	10%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15%
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	20%

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, එවැනි වෙනස්කම් පිළිබිඹු කිරීමට එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර වෙනස්කම් සිදු කරනු ලැබේ.

හානිකරණ

ධාරණ අගය ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය හානිකරණ සඳහා සමාලෝචනය කෙරේ. වත්කම්හි ධාරණ අගය ඇස්තමේන්තු කළ අයකරගත හැකි මුදලට වඩා වැඩි නම්, වත්කම්වල ධාරණ අගය වහාම එහි ආපසු ලබාගත හැකි මුදලට ලියා හැර ඇත.

(ඇ) ආයෝජන

මෙම ආයෝජන ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවලින් සමන්විත වේ. මෙම ස්ථාවර තැන්පතු පිරිවැයට ගිණුම්ගත කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට උපචිත පොළිය ලැබිය යුතු පොලී ලෙස දැක්වේ.

(ඇ) තොග

තොග , ලිපිද්‍රව්‍ය තොග සහ කාර්යාල ඉල්ලීම් වලින් සමන්විත වේ. ඒවා පිරිවැයට දක්වා ඇත.

(ඉ) ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ අපේක්ෂා කළ හැකි අගයකින් පෙන්වනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. අයකරගත නොහැකි බව දන්නා ණය ඒවා හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

(ඊ) මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා, බැංකුවේ මුදල්, අතැති මුදල්, මාස තුනකට අඩු කල්පිරීමක් ඇති බැංකුවල ස්ථාවර තැන්පතු වලින් මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වේ.

(උ) වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ලේකම් කාර්යාලයට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත.

(ඌ) සේවක ප්‍රතිලාභ

අර්ථ දක්වන ලද දායක සැලසුම්

ලේකම් කාර්යාලයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර එම ආයතනය එවැනි සේවකයින්ගේ මූලික වැටුපෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% දායක වේ.

(එ) ආදායම් හඳුනා ගැනීම

i. **ශ්‍රී ලංකා රජයේ දායකත්වය**

ශ්‍රී ලංකා රජයේ දායකත්වය මුදල් පදනම මත පිළිගැනේ. එය ලේකම් කාර්යාලයේ වියදම් පියවීමේ පදනම මත පුනරාවර්තන (අග්‍රිම) සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස බෙදා ඇත.

ii. පොලී ආදායම
පොලී ආදායම උපචිත පදනම මත, කාල සීමාව මත පදනම්ව ගණනය කෙරේ

(ඒ) ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

සේවා පවත්වාගෙන යාම සඳහා හෝ ආයතනයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

02 කෙරීගෙන යන වැඩ - කතරගම නව වැඩිහිටි නිවාසය

	2022	2021
ඉදිකිරීම් ගෙවීම් - GDP Engineering Pvt. Ltd.	173,855,241.23	-
උපදේශන ගෙවීම් - මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය	12,821,543.62	-
සැලසුම් අනුමත ගාස්තු - නාගරික සංවර්ධන අධිකාරිය	154,786.04	-
විදුලි සම්බන්ධතා ගාස්තුව - ලංකා විදුලිබල මණ්ඩලය	2,851,411.54	-
මලාපවහන ගාස්තු - ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	275,712.50	-
එකතුව	**189,958,694.93**	**-**

03 ස්ථාවර තැන්පතු

බැංකුව	ගිණුම් අංකය	2022	2021
ලංකා බැංකුව	89202965 / 87638575	816,839,904.59	763,564,994.03
ලංකා බැංකුව	89251242 / 87695248	367,494,733.64	342,710,115.58
ලංකා බැංකුව	88906968 / 88067250	527,821,956.39	506,473,741.30
ලංකා බැංකුව	89438922 / 87389279	375,000,000.00	350,000,000.00
මහජන බැංකුව	27835-0	-	57,572,045.42
මහජන බැංකුව	33802-7 / 26953-8	88,740,995.03	81,844,315.24
මහජන බැංකුව	32091-9 / 28999-0	84,951,865.56	81,693,094.45
මහජන බැංකුව	35337-9	314,518,356.16	-
මහජන බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව	33803-6 / 35786	178,760,601.72	164,893,039.47
මහජන බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව	34302-0 / 37550	137,573,015.15	125,050,075.35
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	03285	50,000,000.00	-
එකතුව		**2,941,701,428.24**	**2,473,801,420.84**

04 ලැබිය යුතු පොළී

බැංකුව	ගිණුම් අංකය	2022	2021
ලංකා බැංකුව	89202965 / 87638575	100,146,810.22	20,480,277.51
ලංකා බැංකුව	89251242 / 87695248	44,023,855.42	8,469,165.04
ලංකා බැංකුව	88906968 / 88067250	85,384,239.49	6,604,972.63
ලංකා බැංකුව	89438922 / 87389279	35,784,246.58	14,960,821.92
මහජන බැංකුව	27835-0	-	1,424,316.63
මහජන බැංකුව	33802-7 / 26953-8	8,008,570.89	1,499,544.82
මහජන බැංකුව	32091-9 / 28999-0	10,589,890.09	304,390.71
මහජන බැංකුව	35337-9	29,995,572.54	-
මහජන බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව	33803-6 / 35786	16,132,532.11	3,077,626.94
මහජන බැංකුව/ ජාතික ඉතිරිකිරීමේ බැංකුව	34302-0 / 37550	9,426,578.38	1,922,002.53
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	03285	4,646,575.34	-
එකතුව		**344,138,871.07**	**58,743,118.72**

05 මුදල් සහ මුදල් සමාන දෑ

	2022	2021
ගිණුම් අංක 228075 හි මුදල් ශේෂය	8,536,099.05	355,846,655.39
එකතුව	**8,536,099.05**	**355,846,655.39**

06. වැඩිහිටි දීමනාවෙන් රු.100/= අඩු කිරීම

	2022	2021
දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලැබීම්		
2016	427,704,100.00	427,704,100.00
2017	471,094,400.00	471,094,400.00
2018	485,467,300.00	485,467,300.00
2019	502,813,900.00	502,813,900.00
2020	477,200,000.00	477,200,000.00
2021	461,873,100.00	461,873,100.00
2022	473,513,300.00	-
	3,299,666,100.00	**2,826,152,800.00**
ලැබිය යුතු දෑ - 2022	72,910,400.00	-
එකතුව	**3,372,576,500.00**	**2,826,152,800.00**

07 සමුච්චිත අතිරික්තය / (ඌනතාවය)

	2022	2021
ආරම්භක ශේෂය	**62,087,410.60**	**82,553,089.70**
වර්ෂය තුළ ගැලපීම	1,478,143.69	6,155,047.88
වර්ෂය සඳහා අතිරික්ත/ **ඌනතාවය**	120,672,454.65	(26,620,726.98)
අවසන් ශේෂය	**184,238,008.94**	**62,087,410.60**

08 වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

	2022	2021
ආරම්භක ශේෂය	**12,984.35**	**26,984.35**
මුළු ලැබීම්	47,000.00	76,000.00
	59,984.35	**102,984.35**
අඩු: ගෙවීම්	(55,000.00)	(90,000.00)
අවසන් ශේෂය	**4,984.35**	**12,984.35**

09 වෙන්කිරීම් සහ අනෙකුත් ගෙවිය යුතු දේ

විගණන ගාස්තු	2022	2021
ආරම්භක ශේෂය	**138,000.00**	**276,000.00**
අඩු: ගෙවූ ගාස්තුව	-	(414,000.00)
වර්ෂය සඳහා වෙන්කිරීම්	288,000.00	276,000.00
අවසන් ශේෂය	**426,000.00**	**138,000.00**

10 පොලී ආදායම

ස්ථාවර තැන්පතු සඳහා පොලී	2022	2021
වර්ෂය තුළ ලැබූ මුදල්	181,460,147.31	113,759,083.05
වර්ෂය අවසානයේ ලැබිය යුතු දෑ	344,138,871.07	58,743,118.72
	525,599,018.38	**172,502,201.77**
වර්ෂය ආරම්භයේදී ලැබිය යුතු දෑ	(58,743,118.72)	(42,845,519.86)
එකතුව	**466,855,899.66**	**129,656,681.91**

11. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන කරන දිනට **සම්බන්ධිත** පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොතිබුණි.

12.අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව **අසම්භාව්‍ය** වගකීම් නොමැත.

13.මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් පසු සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන **මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් පසු** සිදුවීම් කිසිවක් සිදු නොවීය.

14. සංසන්දනාත්මක සංඛ්‍යා

ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා අවශ්‍ය තැන්වල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත දක්වා ඇත.

15. සභා සාමාජිකයින්ගේ වගකීම

SLPSAS වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභා සාමාජිකයින්ගේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඩී/එන්එස්ර්/එෆ්එස්/2022

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජුනි 23 දින

සභාපති

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 විධිවිධාන වලින් බැහැරව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන්, අරමුදලේ බැරට ලබාගත යුතු දායක මුදල , මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් අරමුදල ආරම්භ කළ 2016 වර්ෂයේ සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව රු.75,431,300 ක අරමුදලට අදාල දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අංක 228075 දරන සමාජ ආරක්ෂණ අරමුදලේ බැංකු ජංගම ගිණුමේ මුදල් පොතේ වැරදි (Error In cash) ලෙස රු.163,214ක් මුදලක් බැංකු සැසඳුමේ ඉදිරියට ගෙන විත් තිබුණි. එකී තැන්පත් නොකළ මුදල් හෝ මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මාස 30 කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මහලේකම් කාර්යාලය 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ලේකම් කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මහලේකම් කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ

අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මෙම වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මහලේකම් කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ (ආ) දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මහලේකම් කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ මහලේකම් කාර්යාලයේ කාර්යය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහලේකම් කාර්යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 16 ක් වෙනුවෙන් රු.මිලියන 26.84 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩිහිටි සුභ සාධන වැඩසටහන් සඳහා රු. මිලියන 50 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 20.525 ක් වැඩිහිටියන් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන සුබසාධන වැඩසටහන් වලට නොයොදා ආයතන වියදම් වෙනුවෙන් මාරු කරගෙන තිබුණි.

(ii) භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුලදී වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ ක්‍රියාකාරකම් අතුරින් ප්‍රධාන ක්‍රියාකාරකම් 03 ක ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතුණි.

(ආ) අරමුදලේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් නැවත සමාලෝචනය කර කාලානුරූපිව සංශෝධනය විය යුතු ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පවතීනම් ඒවා හඳුනාගෙන 2022 ඇස්තමේනතු සකස් කිරීමේදී සංශෝධනය ඉදිරිපත් කල යුතු වුවත් එසේ කිරීමට කටයුතු නොකර වර්ෂය අවසන් වීමට දින කිහිපයක් තිබිය දී සංශෝධන ඉදිරිපත් කිරීම ඵලදායී නොවන බව නිරීක්ෂණයවේ. එසේම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත කාර්යය සාධනය ලගාකර ගැනීමට අපොහොසත් වීම මත ක්‍රියාකාරී සැලැස්ම ද සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි..

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහලේකම් කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) අඩු ආදායම්ලාභී වැඩිහිටි ප්‍රජාවගේ විශේෂ හා හදිසි අවස්ථාවලදී සෞඛ්‍ය , පෝෂණය හා ආරක්ෂණ වැය දැරීම හා වැඩිහිටියන්ගේ සුභසාධනය අරමුණු කර වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන්ගෙන් , එක් ප්‍රතිලාභියෙකුගෙන් මාසිකව රු.100 බැගින් වැඩිහිටි දීමනාවෙන් අයකර වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා

පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර පාර්ලිමේන්තු පනතක් මගින් නෛතික භාවයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

(i) වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා ගෙවනු ලබන වැඩිහිටි දීමනාවෙන් , 2016 ජනවාරි සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව රු.2,902,192,100ක් ලබාගත යුතුව තිබුණ ද , අයකරගෙන තිබුණේ රු.2,826,192,800ක් පමණි. ඉතිරි රු.75,999,300ක් වූ හිඟ මුදල අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට රැස්කරන මුදල් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය , වැඩිහිටියන් සවිබල ගැන්වීම, ආරක්ෂා කිරීම සඳහා වූ අරමුදලේ කාර්යයන් ඉටු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 06ක කාලය තුල අරමුදලට මුදල් බැර කිරීම රු.මිලියන 444.48 සිට රු.මිලියන 546.42 ක පරාසයක් ගනු ලැබුවද එකී කාලය තුල වැය දැරීමකින් තොරව රඳවා ගත් මුදල රු.මිලියන 444.48 සිට රු.මිලියන 202 දක්වා පරාසයක පැවතුණි.

(iii) 2018 - 2022 වර්ෂ 05 ක කාලය තුල වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට ලබාගෙන තිබුණු දායක මුදල් වලින් වැඩිහිටියන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා උපයෝජනය නොකල රු.මිලියන 1,476.15 සිට රු.මිලියන 2,941.70 ක් අතර මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. ඒ අනුව වසර ගණනාවක් පුරා වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව, අරමුදලේ කාර්යයන් ඉටුකිරීමට නොයොදවා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ 07 ක කාලය තුල ලබාදී තිබුණු රජයේ ප්‍රදාන වලින් උපයෝජනය නොකල අරමුදල් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකල රු. 6,137,005ක් වූ අතර ඉකුත් වර්ෂ 07ක කාලය තුල රු.3,201,322 සිට රු.15,001,302 දක්වා පරාසයක වූ මුදල් ශේෂයක් උපයෝජනය කිරීමකින් තොරව බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අතිරික්ත මුදල් ජාතික සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය විධිවිධාන පරිදි සභාවේ කාර්යයක් වූ වැඩිහිටියන්ගේ නිදහස , රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම,අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් නිසි ලෙස සකසන ලද යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, අභිමානය ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාල පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී ද අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා 2016 වර්ෂයේදී රජයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු.4,245,807 කින් රු.2,438,715 ක් වැය කර ඇතත් ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු මේ දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092 ක් වූ මුදල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 06 ක පමණ කාලයක සිට නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ඊ) කාන්තා , ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට අයත් ජීප් රථය එම අමාත්‍යාංශයේ ධාවන කාලයේදී සිදුකළ අලුත්වැඩියා වෙනුවෙන් මහ ලේකම් කාර්යාලය විසින් අවිධිමත් ලෙස රු. 1,585,521 ක් දරා තිබුණද ප්‍රමාණවත් ලෙස ධාවනයට යෙදවීම වෙනුවෙන් ජීප් රථය රඳවාගැනීමට හෝ වැයකළ අලුත්වැඩියා වියදම අයකර ගැනීමට හෝ කටයුතු නොකර, ජීප් රථය ආපසු භාරදීම තුලින් මහලේකම් කාර්යාලයට රු. 1,585,521 ක පාඩුවක් සිදු වී තිබුණි. වර්ෂ 03 කට ආසන්න කාලයක් ඉකුත් වී තිබුණ ද , මහලේකම් කාර්යාලය විසින් දැරූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(උ) වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙත මාසිකව රු.2,000 ක දීමනා ගෙවීමට අදාලව වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2000 ක මාසික දීමනාවක් ගෙවීමේදී දීමනාලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තා වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර දීමනාලාභීන් සංඛ්‍යාව, ගෙවූ දීමනා වටිනාකම් හා මාසය තුල ගෙවීම් නොකල ප්‍රතිලාභීන් පිළිබඳව විස්තර, යනාදිය ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට වැඩිහිටි මහලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ii) දත්ත පද්ධතියක් නොමැති තත්ත්වය මත ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.2000 ක දීමනා ගෙවීම් පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විස්තර වාර්තා සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විස්තර වාර්තාවල වෙනස්කම් පැවතීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගණකාධිකාරීන් විසින් එකී වාර්තා සහතික කිරීම ප්‍රතික්ෂේප කර තිබුණු අවස්ථාවන් නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) ජ්‍යෙෂ්ඨ ගණයේ කාර්යමණ්ඩලය වූ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) , සහකාර අධ්‍යක්ෂ (පාලන) ,නීති නිලධාරී, සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) යනාදී ප්‍රධාන තනතුරු දීර්ඝ කාලීනව පුරප්පාඩු පවතින අතර ගණකාධිකාරී තනතුර ද වැඩ බැලීමේ පදනම මත පත් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

<u>වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් කළමණාකරණයේ අදහස් හා නිවැරදි කිරීමට ගෙන ඇති පියවර</u>

<u>1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) පෙර වර්ෂවල මුදල් පදනම මත සමාජ ආරක්ෂණ දායක මුදල් ගිණුම්වල පෙන්වා තිබුණද 2022 මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල එය උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. වර්ෂයට අදාලව දායක මුදල් ආදායම් ලෙසත් ලැබිය යුතු ප්‍රමාණය ජංගම වත්කම් ලෙසත් වර්ග කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති බව දන්වමි.

(ආ) එවකට බැංකු සැසඳුම් හා සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කල නිලධාරින් මේ වන විට ආයතනයේ නොමැති බැවින් හා අදාල ලේඛණ සොයාගත නොහැකි බැවින් මේ සම්බන්ධව ලබාගත් තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිරවුල් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් මේ සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලබන බව කාරුණිකව දන්වමි.

2.2.2

2022 වර්ෂයට අදාල වාර්ෂික වාර්ථාවේ කෙටුම්පත 2023.06.19 වන දිනැති NSE/Dev/13/04 අංක දරණ ලිපිය මගින් විගණකාධිපති වෙත ලබා දී ඇති බව දන්වමි. ඉදිරි වර්ෂයේදී මෙවැනි ප්‍රමාදයන් නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

2.2.3

(අ) (i) 2022 වර්ෂයේදී රාජ්‍ය වියදම් සීමාකිරීම මත වර්ෂය ආරම්භයේදී සැලසුම් කර තිබූ ඇතැම් වැඩිහිටි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සීමාවිය. එමෙන්ම ඉන්ධන , ජලය , දුරකතන , තැපැල් , විදුලිය ආදි අත්‍යවශ්‍ය වියදම් ඉහල යාම හේතුවෙන් වැඩිහිටි මහලේකම් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ආයතන වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිය. මේ හේතුවෙන් වැඩිහිටි සුබසාධන වැඩසටහන්වල අතිරික්ත ප්‍රතිපාදන නියමිත ක්‍රමවේදයට අනුව ආයතනයේ වියදම්වලට මාරු කර ගැනීම සිදුකල බව දන්වමි.

(ii) මුදල් අමාත්‍යාංශය මගින් මගේ අංක BD/CBP/01/01/04-2022 හා 2022.04.26 වන දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 චක්‍රලේඛනයට අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා රාජ්‍ය භාණ්ඩාගාරය මඟින් මුදල් ප්‍රතිපාදන නිදහස් නොකිරීම හේතු කොට ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් ද ඉල්ලීම් අනුව වැඩිහිටියන් සඳහා මූල්‍යාධාර ලබා දීම වෙනුවෙන් වර්ෂය තුළ ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබූ බැවින් ද වැඩසටහන් වල ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතුනි.ඉදිරි වර්ෂ වලදී ඉල්ලීම් නොලැබෙන වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඇතුලත්කර නොගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

(ආ) 2022 වර්ෂයේ මුල් කාර්තු 03 තුළ රට තුළ පැවති ආර්ථිකමය ගැටලු හමුවේ වැඩසටහන් සිදු කිරීමේදී සිදු වූ අතපසුවීම් හා 2022.04.26 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද BD/CBP/01/05/04 – 2022 අංක දරණ චක්‍රලේඛයන්ට අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වැඩසටහන් නතර කරන ලදී. පසුව වර්ෂ අවසානයේදී ලැබුනු ඉල්ලීම් පදනම් කරගනිමින් වැඩසටහන්වල අවශ්‍යතාවය මත ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධනයන් කිරීමට කටයුතු කරන ලදී.

2.2.4

(අ) 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වන වගන්තියේ පළවන උප වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල පිහිටුවා ඇත. ඒ අනුව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීමට මුල් වන 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුව නීත්‍යානුකූලව පිළිගැනීම ලැබීම තුළින්ම මෙම අරමුදලෙහි වලංගුභාවය, නීත්‍යානුකූලභාවය හා විනිවිදභාවය ප්‍රකාශ වී ඇත. ඔබගේ නිරීක්ෂණයන්ට අනුව මෙකී අරමුදල සඳහා ජනාධිපතිවරයා, මුදල් අමාත්‍යවරයා අනුමැතිය නොලැබුන ද මෙම අරමුදල පිහිටුවීමට පාදක වන 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ඉහත සඳහන් කළ පරිදි පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැසට් පත්‍රයේ පළ කර ඇත.

(i) මාසිකව අවු 70ට වැඩි වැඩිහිටි පුද්ගලයන්ට ගෙවනු ලබන දීමනාව පදනම් කරගෙන ප්‍රාදේශිය හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අදාල අවකරණ මුදල් වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රේෂණය කරනු ලබන අතර එම මුදල් නිසියාකාරව අරමුදලට බැර කර ඇති බව දන්වමි. එලෙස මාසිකව අවකරණ මුදල් නොඑවන, ගෙවීම් ප්‍රමාද කරන කාර්යාලවලට සිහිකැඳවීම් යවා ඇති අතර 2022 වර්ෂයට අදාලව මේ දක්වා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02ක් හැර ඉතිරි මුදල් සියල්ල අයකර ගෙන ඇත.

(ii) සමාජ ආරක්ෂණ අරමුදලේ ප්‍රථම ක්‍රියාකාරි සැලැස්ම සකස් කර අනුමත කරගනු ලැබුවේ 2019 වර්ෂයේදී වන බැවින් 2017, 2018 වර්ෂවල එම අරමුදලට අදාල වැඩිහිටි සුබසාධක වැඩසටහන් ක්‍රියාත්මක නොවීය. තවද 2020 සහ 2021 වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්වය හා 2020 වර්ෂයේ පැවති ආර්ථික ගැටලු හමුවේ භාන්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 03/2022 චක්‍රලේඛය පරිදි වැඩසටහන් තාවකාලිකව අත්හිටවූ බැවින් සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන්ද 2022.04.26 දිනෙන් පසුව සිදු නොවුනි. එමෙන්ම එම වැඩසටහන් ක්‍රියාක්මක කිරීම සඳහා නැවත ජාතික සභා අනුමැතිය ලබාගෙන තිබුණි. 2022.06.22 දිනැති සභාව මගිනි. එබැවින් එම අතරමැදි කාලය තුළ වැඩසටහන් නතර කිරිම අපේක්ෂිත ප්‍රතිපළ ලඟා කර නොගැනීම සඳහා හේතුවක් විය.

(iii) 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතහි iv වන කොටස මුදල් යටතේ අංක 21ට අනුව ජාතික සභාවට අයත් මුදල් ජාතික සභාව විසින් තිරණය කරන ආකාරයට ආයෝජනය කල හැක. ඒ අනුව අතිරික්ත මුදල් ජාතික සභාවේ පූර්ව අනුමැතිය ඇතිව රාජ්‍ය බැංකු අතරින් ඉහලම පොලි අනුපාතයක් ලබා දෙන බැංකුවෙහි විශේෂ පොලි අනුපාත (සාමාන්‍ය පොලි අනුපාතයට වඩා ඉහල) යටතේ මෙම ආයෝජන සිදුකර ඇති බවත් ඉන් ලැබෙන පොලි ආදායම මගින් අරමුදල තවත් ශක්තිමත් වී ඇති බවත් කාරුණිකව දන්වමි.

(ආ) වාර්ෂික ප්‍රතිපාදන යටතේ භාණ්ඩාගාරය විසින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ප්‍රධාන වශයෙන් ලබා දෙන මුදල් ආයෝජනය කිරිම සඳහා ප්‍රතිපාදන නොමැත. 2022 වර්ෂයේදී රාජ්‍ය වියදම් සීමා කිරීම යටතේ ඇතැම් වැඩිහිටි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා ලැබුණු මුදල්වලින් කොටසක් මෙසේ වර්ෂය අවසානයේ ඉතිරි වී පැවතිණි. කෙසේ නමුත් මෙම මුදල් 2023 වර්ෂයේ ආරම්භයේදී වැඩසටහන් සඳහා වියදම් කල බව දන්වමි.

(ඇ) මෙම ආයතනයේ නිල වෙබ් අඩවියේ රු.2,000/- දීමනාව සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් යාවත්කාලීන වන වැඩිහිටි දත්ත තොරතුරු පද්ධතියක් උඩුගත කර ඇත. ඊට අමතරව විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරිම සඳහා තොරතුරු රැස් කරන ලෙස නිලධාරින් දැනුවත් කර ඇත.

(ඈ) එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් රජය ගනු ලැබූ ප්‍රතිපත්ති යටතේ 2021 වර්ෂයේ පසුවිපරම් කටයුතු සිදු කිරීම සීමා කිරීමට සිදු විය. මෙම වර්ෂයේ සිට පසුවිපරම් කටයුතු නිසි ආකාරව සිදු කිරීමට නිලධාරින් දැනුවත් කර ඇත.

(ඉ) 2016 වර්ෂයේ කෙටුම්පත් කරන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ප්‍රතිපත්තියේ අතුලත් කරුණු 2022 වර්ෂයේ උපාය මාර්ගික සැලැස්ම අනුව සකස් කරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ප්‍රතිපත්තියට ඇතුලත් කර නව ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස 2023.05.29 වන දින පවත්වන ලද රැස්වීමේදී ජාතික සහා සාමාජික මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව නැවත සකස් කරන ලද ප්‍රතිපත්ති මාලාව අවශ්‍යතාවය මත වෙනස්කම් සිදු කරමින් පවතින බවත් මෙය කඩිනමින් ඉටු කිරීමටත් සටහන් කර ගන්නා ලදී.

(ඊ) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ පැවති සංචිත වාහන ප්‍රමාණවත් නොවීම මත එවකට සිටි අධ්‍යක්ෂතුමන්ගේ නිල රථය ලෙස භාවිත කිරීම සඳහා මෙම රථය රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ලබා ගෙන තිබුණි. එම අධ්‍යක්ෂතුමන්ගේ සේවා කාලය අවසන් වීමත් සමග ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස සමාජ සේවා අධ්‍යක්ෂ කටයුතු කිරීමේදී එතුමාගේ නිල රථය ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් රථයක් භාවිතා කරන ලදී. එම තත්වය තුල මෙම රථය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සංචිත වාහන වලට ගනු ලැබූ අතර, පසුව කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයට වාහනය නැවත බාර දී ඇති බව දන්වමි.

(උ)

(i). NSE/DEV/03/04/ හා 2018.10.15 දිනැති චක්‍රලේඛයේ 5.3 වගන්තිය අනුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ විසින් NSE/DEV/EMA/EXR -002ට අනුව ලබාදෙනු ලබන වාර්තා අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් NSE/DEV/EMA/EXA-003 පරිදි මාසික සාරාංශ සකස් කරන ලද අතර, එම වාර්තා අනුව තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. තවද 2020 හා 2021 වර්ෂ වලදී පැවැති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් එම වාර්තා ලබාදිමේ ප්‍රමාදයක් පැවැති අතර, මාසික සාරාංශ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදීමේ ප්‍රමාදයක් වූ බව වැඩිදුරටත් දන්වන අතර, ඉදිරියේදී නියමිත පරිදි වාර්තා ලබාගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි.

(ii). රු.2, 000/- දීමනාව තැපැල්/උපතැපැල් කාර්යාල හරහා ප්‍රතිලාභීන් වෙත මුදල් ගෙවා ඉතිරි මුදල් නැවත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත මුදල් ඇනවුමක් මඟින් ලබාදීමට කටයුතු කරනු ලබයි. එහිදී අදාල මසට ලබාදිය යුතු ඉතිරි මුදල එම දීමනාව ගෙවන ලද මසදීම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත නොලැබෙන අතර මුදල් ඇණවුම ඊළඟ මසදී ද ලැබෙන අවස්ථාවන් පවතින අතර, එහිදී වාර්තා වල වෙනස්කම් පවතින බව පැහැදිලි විය. එසේ හෙයින් නැවත එම වාර්තා ගෙන්වා ගැනීමේදී අදාල මසට නියමිත වාර්තා එම මස තුලදීම ලබාගැනිමට කටයුතු කරන ලෙස දන්වා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත දන්වා යවන ලදි.

2.3 වෙනත් කරුණු

(අ) 2020.10.26 දිනැති අංක 02/2020 චක්‍රලේඛය මගින් බඳවා ගැනීම් සීමා කිරිම හේතුවෙන් අදාල බඳවා ගැනීම් සිදු කිරිම සඳහා කටයුතු නොකරන ලද අතර, නව බඳවා ගැනීම් සඳහා රජයේ අවසරය ලද පසු එම තනතුරු වෙත කඩිනමින් බඳවා ගනීම් පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරිමට කටයුතු කරනු ලැබේ. එතෙක් ආයතනයේ රාජකාරි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට සුදුසු පියවර ගෙන කටයුතු කර ඇත.

කේ.ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය